
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk


ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ බිනර පුර අටවක පෝ ද, 2021 සැප්තැම්බර් 13 සඳුද BUDUSARANA MONDAY SEPTEMBER 13, 2021

56 කාණ්ඩය, 12 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 16



අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේ

# ආහාරය බෙහෙතක් ලෙස නොගත්තොත් බෙහෙත් ආහාර ලෙස ගන්නට සිදු වේවි



ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
දක්ෂිණ ලංකාවේ
ප්‍රධාන සංඝනායක, ආචාර්ය
**ඕමල්පේ සෝභිත නා හිමි**

**මිනිසා විතරක් නොවෙයි, සෑම සත්වයකු ම මුහුණ දෙන බරපතළ ම රෝගය කුමක් ද? සම්බුද්ධ දේශනයට අනුව නම් එය වෙන කිසිවක් නොව බඩගින්න යි. "ජිගච්ඡා පරමා රෝගා" යන ධම්මපද ඉගැන්වීම තුළින් පැහැදිලි වන්නේ ඒ කරුණයි.**

බඩගින්න රෝගයක් නම්, එයට ප්‍රතිකාරයක් තිබෙනවා. ඒ, "ආහාරය" යි. එසේ නම් ආහාරය කියන්නේ වෙන කිසිවක් නොව බෙහෙතක්. එය කුසගින්න නමැති, අප හැම දෙනා ම දෛනිකව ම මුහුණ දෙන රෝගය සුවකර ගැනීම සඳහා අනිවාර්යයෙන් ගත යුතු ඖෂධය යි.

මෙහිදී,

"ඔබ ආහාරය බෙහෙතක් වශයෙන් සලකා පරිභෝග නොකළොත් අනාගතයේදී ඔබට බෙහෙත් ආහාර වශයෙන් ගන්නට සිදු වනවා."

යන සම්බුද්ධ දේශනය පිළිබඳ ව අපගේ අවධානය යොමු කළ යුතු වනවා.

අද, සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 35 පමණ ඉක්මවා යන විට වැඩි දෙනකු තම ජීවිතය බෙහෙත් මත ම යැපෙන්නට පෙළඹී සිටින ආකාරය යි අපට දකින්නට ලැබෙන්නේ.

එහෙත් සංසන්දනාත්මක ලෙස සලකා බලන විට පෙනී යන්නේ මීට දසක දෙක තුනකට පෙර පැවති තත්ත්වය අදට වඩා සුභදායක බව යි. එදා පිළිකා රෝගියකු ගැන ඇසුවත් කා තුළත් ඇති වන්නේ සංවේදී බවක් සමඟ අනියත බවක්. ඒ වගේ ම එය ඉතා දුලබ ආරංචියක්. අද වන විට ඒ තත්වය බොහෝ වෙනස්. එක පැත්තකින් පිළිකා රෝගීන් ඉතා සුලබයි. නිරන්තරයෙන් අසන්නට, දකින්නට ලැබෙන නිසා සාමාන්‍ය දෙයක් බවට පත් වෙලා. වාර්තා වන අන්දමට මහරගම අපේක්ෂා රෝහලට පමණක් දෛනික සාමාන්‍ය ඇතුළත් කිරීම් 70 ක් පමණ වනවා. එහෙත් ඒ ගැන සාමාන්‍ය සමාජය තුළ හැඟීමක් ඇති බවක් පෙනෙන්නේ නෑ.

වකුගඩු ආසාදනය වැනි බෝ නොවන අනෙකුත් රෝගාබාධ සම්බන්ධයෙන් වුව ද තත්ත්වය මෙසේ ම යි. මේ ගැන සංවේදී වන්නට නම්, තමන් හෝ තමන්ගේ පවුලේ හෝ කෙනෙක් මේ තත්වයට පත් විය යුතු ම යි. මේ යන රටාව අනුව නම් බොහෝ දෙනකුට එම තත්වයට මුහුණ දෙන්නට වන කාලය ද වැඩි ඈතක නොවනු ඇති.

මේ රෝගාබාධ බොහොමයකට වැඩි වශයෙන් බලපාන්නේ අපේ ආහාර රටාව ඇතුලු අයහපත් ජීවන රටාවයි.

ඒ වගේ ම විවිධ බෙහෙත් වර්ගවලට යොමු වීම වැඩි වන තරමට ම වෙනත් රෝගාබාධ තත්ත්වයන් ද වැඩි වෙන බව මිස අඩු වන බවට සාධක නැත යන්න දැනට පිළිගෙන ඇති සත්‍යය යි. මේ පිළිබඳ චෝදනාව සෘජු ලෙස ම එල්ල වන්නේ බටහිර පන්නයේ ඇලෝපති ක්‍රමය වෙත ය යන්න ද බොහෝ දෙනෙක් චෝදනා නගනවා.



වත්මන් හි ලොව පුරා සිදුවන මරණ සංඛ්‍යාව හා එයට හේතු සාධක පිළිබඳ විමසීම ද මෙහිදී වැදගත් වනවා. 2016 බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාවට අනුව ඖෂධ හා සම්බන්ධ කරුණු නිසා සිදුවන මරණ සංඛ්‍යාව අතිවිශාලයි. එහෙත්,

බොහෝ දෙනෙක් කටයුතු කරන්නේ ආහාරය පිළිබඳ යතාර්ථය අමතක කිරීමෙනු යි. ඒ අනුවණකම ම අප ගේ විනාශයට හේතු වී ඇති බව පිළිගත යුතු යි.

මුලින් ම සඳහන් කළ පරිදි මේ පිළිබඳ බුදුරජාණන් වහන්සේ ගේ ආකල්පය, අප ගේ සෞඛ්‍යයට පමණක් නොවෙයි, සදාචාරාත්මක ජීවිතයටත්, ආර්ථික දියුණුවටත් ඒකාන්තයෙන් ම බලපානවා.



## හිතේ හැටියට නොව කුසේ හැටියට කෑම

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ ආහාර ගැනීමේ පරමාර්ථය නිවැරැදි විය යුතු බව යි. සාමාන්‍ය පුද්ගලයකු ආහාර ගන්නේ බඩගින්න නිවා ගැනීම ම අරමුණු කර ගෙන නොවේ. ඔහු මුලින් ම ආහාරයේ රසයට මුල් තැන දෙයි. ශරීරයේ සුන්දරත්වයට වගේ ම සමාජ තත්වයට ද මුල් තැන දෙයි. මේ ආකල්පය නිවැරැදි නොවෙයි. එය මෙසේ නිවැරැදි විය යුතු යි.

"මා ආහාර ගන්නේ බඩගින්න නිසා ඇතිවෙන ශරීර පීඩාව නැති කර ගැනීමට යි.

මේ ශරීරයේ යහ පැවැත්ම සඳහා යි; (ඉමස්ස කායස්ස ඨිතියා)

මැනවින්, නිරෝගී ලෙස ශරීරය පවත්වා ගෙන යාම සඳහා යි (යාපනාය)

තමාටත් අනුන්ටත් ප්‍රයෝජනවත් පරිදි යහපත් ලෙස කටයුතු කිරීම පිණිස ශක්තිය ලබා ගැනීම සඳහා යි. (බ්‍රහ්මචරියානුග්ගහාය.)

මේ අනුව ආහාර ගැනීම කෙතරම් විද්‍යානුකූල ද? මානව හිතකාරී ද? ඒ බව වත්මන් පෝෂණවේදීන් විසින් ද විවාදයකින් තොරව ම මහත් හරසරින් යුතු ව පිළිගෙන තිබෙනවා.

මේ සංකල්පය වර්තමාන බටහිර විචාරකයන් හඳුන්වන්නේ කල්පනාකාරී ආහාර ගැනීම යනුවෙන්. බෞද්ධ ජීවන මාර්ගයෙහි ආහාර ගැනීම ද භාවනාවේ කොටසක් ලෙසින් සිදු කළ යුතු අත්‍යවශ්‍ය චර්යාවක් බව තවදුරටත් දක්වනවා.

මජ්ඣිම නිකායේ සබ්බාසව සූත්‍රයේ දැක්වෙන බුද්ධ දේශනාවට අනුව ඉදිරිපත් කෙරුණු ඉහත සඳහන් විස්තරය බුද්ධ ශ්‍රාවකයන්ට අනිවාර්ය ය වූවක් . එය භික්ෂු විනයේ දැක්වෙන්නේ "පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව" ලෙස යි.

ජීවිතයේ පැවැත්මට ත් , නැවැත්මට ත් ඒකාන්තයෙන් ම ප්‍රධාන වන්නේ ආහාරය යි. ඒ බව "සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා" යන ධර්ම පාඨයෙන් ද පැහැදිලි වෙනවා.

> මාලුවා නහින්නේ කට නිසා කියලා අපේ ජන වහරේ අපූරු කියමනක් තිබෙනවා. ආහාරයේ දී ද කට පරිස්සම් කර ගැනීම ඉතා වැදගත්.

## කෑදරකමට තිතක් තියමු

නිරෝගී ජීවිතයකට නම්, ආහාරය පිළිබඳ ව පවතින ආකල්පයේ වෙනසක් ඇතිකර ගත යුතු යි.

පළමුව ආහාරයෙහි කෑදරකම නැති කර ගත යුතු යි. රස තෘෂ්ණාව මුල් කරගත් එම පුරුද්දදිව පිනවීම ම බලාපොරොත්තු වනවා.

මාලුවා නහින්නේ කට නිසා කියලා අපේ ජන වහරේ අපූරු කියමනක් තිබෙනවා. ආහාරයේ දී ද කට පරිස්සම් කර ගැනීම ඉතා වැදගත්. අනවශ්‍ය දේ කටට නොගත යුතු ම යි. ඒ සඳහා කට වටකර වැට බැඳිය යුතු ම යි. මෙහිදී ආහාරයේ ගුණදායක බවට ම මුල් තැන දිය යුතුවනවා.

එසේම පාට, සුවඳ, බාහිර හැඩය හෝ ආකර්ෂණීය බව සපුරා ම නොසලකා හැරිය යුතු වනවා.

සිතේ ප්‍රමාණයට වඩා තමන් ගේ කුසට සරිලන ප්‍රමාණය ගැන සලකා ආහාර ගත යුතු වනවා. බාහිර සමාජයට පෙනෙන්නට හෝ තමාගේ ඇති හැකි බව ප්‍රදර්ශනය කිරීම සඳහා නොව තමා ගේ ආර්ථිකයට සරිලන සරල ආහාර වේලකට යොමු විය යුතු වනවා.

කතාබහ, වාද විවාද ආදියට හෝ වෙනත් දෙයකට අවධානය යොමු නොකර ආහාර ගැනීමේ දී ඒ ගැන පමණක් ම දැඩි ලෙස අවධානය යොමු කරමින් එහි නියැළී ම ද කළ යුතුයි. එහි දී ආහාරයේ පවත්නා විවිධාකාර වූ රස කොටස් හොඳින් විඳ ගන්නට හැකි වනු ඇති.

## ආහාර ගැනීමේ දී ත් ඉවසීමක් ඕනෑ

සමහරු පුරුදු වී සිටින්නේ කෙටි කාලයකින්, හදිසියේ, ඉක්මන් ලෙස ආහාර ගැනීමටයි. ආහාර ගැනීමේ දී ත් රටාවක් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සම්පූර්ණ කාලය ම ඉවසීමෙන් යුතු ව වෙන් කළ යුතු යි. සිරුර මනා ලෙස තැන්පත් කර ගෙන, ඒ කියන්නේ සුදුසු පරිදි හිඳගෙන, සිත ද ඒ අයුරින් ම තැන්පත් කර ගෙනයි ආහාරය ගත යුතු වන්නේ. අනුන් මොනතරම් පෙරැත්ත කළත්, තමාට අගුණ හෝ අපුල දේ ප්‍රතික්ෂේප කළ යුතු ම යි.

13 පිටුවට...

# වෛරී සිත භයානක යි
## දුරු නො කළොත් සසර පුරා පසුපස එනවා



නමෝතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**හිතානුකම්පී සම්බුද්ධො -**
**යදඤ්ඤ මනුසාසති**
**අනුරෝධ විරොධෙහි -**
**විප්පමුත්තො තථාගතො'ති.**

**පින්වත්නි,**
**අද ධර්ම දේශනය සඳහා මාතෘකාව වන්නේ සංයුක්ත නිකායේ මාර සංයුක්තයේ රාජ වග්ගයට අයත් පතිරූප සූත්‍රය යි.**

දිනක් බුදුපියාණන් වහන්සේ කොසොල් ජනපදයට අයත් ඒකසාලා කියන බ්‍රාහ්මණ ගමේ දී විශාල පිරිසකට ධර්ම දේශනයක් පවත්වමින් වැඩ සිටියා. කවදත් ලෝක සත්වයා සසරෙහි බැඳ තබා ගන්නට වෙර දරන මාරයා ඒ වෙලාවේ දී එම ස්ථානයට පැමිණියා. දහම් අසන අයට බාධා වන අයුරින් ගාථාවක් ප්‍රකාශ කළා. ඒ ගාථාවේ සරල අදහස තමයි, යම් හෙයකින් අනුන්ට අනුශාසනා කරනවා ද, එය ඔබට සුදුසු නොවෙයි. එහෙම අනුශාසනා කිරීමෙන් රාග, පටිඝ කියන දෙකෙහි ගැලෙන්න එපා කියල යි මාරයා බුදුපියාණන් වහන්සේට ප්‍රකාශ කළේ.

මේ විදිහට මාරයා ක්‍රියා කළේ පිරිස ඉදිරියෙහි බුදුපියාණන් වහන්සේ අධෛර්යයට පත් වේවි කියලා හිතාගෙන යි. මාරයා හිතුවා ශ්‍රාවක පිරිස අතරේ ඇතැමෙක් සාධුකාර දේවි, ඇතමෙක් වෙන වෙන කතාවල යෙදේවි, එවිට දේශකයා තුළ රාගයත්, ක්‍රෝධයත් ඇති වේවි කියලා.

මේ වෙලාවේ බුදුපියාණන් වහන්සේ මා මුලින් මාතෘකාව වශයෙන් තබා ගත් "හිතානුකම්පි සම්බුද්ධො" කියන ගාථාව දේශනා කොට වදාළා. එහි අදහස තමයි, "යම් හෙයකින් සර්වඥ වූ බුදුපියාණන් වහන්සේ ලෝක වාසීන් කෙරෙහි අනුකම්පාවෙන් ධර්මය දේශනා කරන සේක් ද, ඒ බුදුපියාණන් වහන්සේ රාගයෙන් හා ද්වේෂයෙන් විශේෂයෙන් මිදුණු කෙනෙක් ය" කියන වග.

පින්වත්නි, ලෝකයේ ස්වභාවය තමයි, තමන්ට හිතවත්, තමන් කැමති පරිදි කටයුතු කරන, තම සිත්ගන්නා සුළු යම් වස්තුවක් හෝ සත්වයෙක් වේ නම්, එයට ඇලුම් කිරීම. අප බුදුපියාණන් වහන්සේ එය හැඳින්වූයේ අනුරෝධය කියලා. එහෙමත් නැත්නම් රාගය, ආදරය, ආශාව, කියන වචනත් එයට පාවිච්චි කරන්න පුළුවනි. ඒ වගේම තමයි. තමන් ගේ සිතැඟිවලට, එහෙම නැත්නම් ආශාවන්වලට එරෙහි ව යම් වස්තුවක් හෝ සම්බන්ධයක් තියෙනවා නම්, එයට විරුද්ධ වීමත් පුහුදුන් මිනිසුන්ගේ ස්වභාවයක්. අපි ඒකට කියනවා "පටිඝ" කියල. පටිඝ කියල කියන්නේ විරුද්ධ වූ අරමුණු සමඟ ගැටෙනවා කියන එකයි.

ඒ නිසා අපි තේරුම් ගන්න ඕන රාගයත්, පටිඝයත් කියන කෙලෙස් ධර්ම දෙක මනුෂ්‍යයා ගේ සිතෙහි අඩු වැඩි වශයෙන්



බිනර පුරඅටවක පෝද
## දම් දෙසුම

පවතින ලක්ෂණ දෙකක් බව. එහෙම වුණත් පින්වතුනි, අප සම්මා සම්බුදු පියාණන් වහන්සේ වැනි උත්තමයකු ගේ සිතේ මේ කෙලෙස් ධර්මවල නැඟී සිටීමක් කවදාවත් ඇති වෙන්නේ නෑ.

ඒ නිසා, අප තේරුම් ගත යුතු දේ තමයි, සත්වයා සසරේ බැඳ තබා ගන්නට ඉවහල් වන මේ සංයෝජන (රැහැන්) අවබෝධයෙන් සිඳලා බිඳලා දාන්න. රාගයත්, ද්වේෂයත් සිතේ බලපවත්වනකම් අපිට පුළුවන් කමක් නෑ සසරින් අත්මිදෙන්න. ඒ විතරක් නෙමෙයි, ලෞකික ජීවිතය අවුල් වියවුල්වලින් තොරව පවත්වා ගෙන යාමට පුළුවන් වෙන්නෙත් නෑ.

රාගය හා ද්වේෂය පුද්ගලයා තුළ හටගත්තම මනා සිහිනුවණ කියන දේ නැති වෙලා යනවා. ඇත්ත - නැත්ත, යුක්තිය - අයුක්තිය තේරුම් ගැනීමට බැරි අන්ධයකු බවට පත්වෙනවා. ඒකට හොඳම නිදසුනක් තමයි, බෝසත් වුවත් කුස රජතුමා පබාවතිය කෙරෙහි බැඳගත් ආලය නිසා, එයින් අන්ධවෙලා රජකම පවා අමතක කරලා සත් මසක් අරක්කැමියෙක් හැටියට කටයුතු කරපු ආකාරය. ඒ නිසා අප රාගයෙන් මිදී විරාගී වීම සසරින් මිදෙන්නට තියෙන මූලික සුදුසුකමක් බවයි.

බුදුපියාණන් වහන්සේ අපට උගන්වා වදාළේ.

ඒ වගේම තමයි ද්වේෂය. රාගය තරම් ම ද්වේෂයත් බලවත් පින්වතුනි. එය වෛරයක් වීමෙන් ආත්ම සිය ගණනක් වුවත් අප පසුපස එන්න පුළුවන්. ද්වේෂයෙන් දූෂිත වූ සිතකට යහපත් දෙයක් ඉස්මතු වෙන්නේ නෑ. හොඳ දෙයක් සිතන්නේ නෑ. හොඳ දෙයක් කියන්නේ නෑ. හොඳ දෙයක් කරන්නේ නෑ. ක්‍රෝධයෙන් අන්ධවෙලා බාහිර සමාජයට හිරිහැරයක් ම යි කරන්න පෙළඹෙන්නේ.

මෙම සූත්‍රයේ එන කරුණුවලට අනුව පැහැදිලි වෙනවා තථාගතයන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන් කෙරෙහි මධ්‍යස්ථ ප්‍රතිපදාවක් අනුගමනය කළ බව. උන්වහන්සේ විරාගී චරණයක් පුරුදු කර තිබූ බව මෙයින් පැහැදිලි වෙනවා. සර්වඥයන් වහන්සේ ධර්ම දේශනා කළේ ලෝක සත්වයා කෙරෙහි අප්‍රමාණ අනුකම්පාවෙන් ම යි. උන්වහන්සේ ගේ එකම අභිප්‍රාය වුණේ දුකට පත් සියලු සත්වයින් මුදවා ගන්න යි.

ඒ නිසා පින්වත්නි, අප බුදුපියාණන් වහන්සේ අපට උගන්වා වදාළේ, මහණෙනි, ලෝකයා, මටත් ධර්මයටත්, සංඝයාටත් දෙස් පවරන අවස්ථාවේ ඔබ එයට එරෙහි නොවිය යුතු ය. ද්වේශ නොකළ යුතු ය. අප කෙරේ ගුණ කියන විට උද්දාමයට පත්විය යුතු ද නැත. යමෙක් රාග ද්වේෂ දෙකෙන් යුතු ව අදානග්‍රාහී ව කටයුතු කරන්නේ වේ ද, එයින් ම ඔහු විනාශයට පත් වෙන බව යි.

මේ සූත්‍රයෙන් කියැවෙන්නේ තථාගතයන් වහන්සේ රාග, ද්වේෂ දෙකෙන් මිදී ලෝක සත්වයා වෙත දයානුකම්පාවෙන් යුතු ව අනුශාසනා කරනු ලබන බව යි. මෙසේ වදාළ කල, මාර තෙම එහි ම අතුරුදන් වුණා. එකී බුද්ධ වචනය සිහියට ගෙන අප ද රාග ද්වේෂාදීන්ගෙන් මිදී නිවන්පුර දොරටුව විවර කර ගමු.


**‘ ඒ වගේම තමයි ද්වේෂ ය. රාගය තරම් ම ද්වේෂයත් බලවත් පින්වතුනි. එය වෛරයක් වීමෙන් ආත්ම සිය ගණනක් වුවත් අප පසුපස එන්න පුළුවන්. ’**




බූස්ස පිටිවැල්ල ජයවර්ධනාරාමාධිපති
අමරපුර ශ්‍රී කල්‍යාණිවංශ නිකායේ
විධායක ලේඛකාධිකාරී
ශාස්ත්‍රපති
**තංගල්ලේ අනුරුද්ධ නාහිමි**

මෙම 17 වැනිදාට යෙදෙන අනගාරික ධර්මපාලතුමා ගේ ජන්ම දිනය නිමිත්තෙනි.

# ජාතිය පුබුදුවා ධර්මාලෝකය විහිද වූ අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ





උඩුරුගමුවේ අස්සජී හිමි

**19 වන සියවසේ මැද භාගය වන විට ශ්‍රී ලාංකික බොහෝ දෙනා තුළ රට ජාතිය හා ආගම පිළිබඳ වූ අභිමානයත්, ආදරයත් බොහෝ සෙයින් ම යටපත් වී තිබුණි. දීර්ඝ කාලයක් අප ශ්‍රී ලංකාද්වීපය පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයන්ට යටත් ව යටත් විජිතයක් ලෙස පැවතීම එයට හේතුවයි.**

අපේක්ෂා භංගත්වයෙන් හා ආත්ම විශ්වාසයෙන් තොරව ජීවත් වූ සිංහල ජනතාවට එම පරගැති වහල් භාවයෙන් මිදී නිදහස් ව නිවහල් ව ජීවත්වීමට යෝග්‍ය පසුබිම සකස් කර දීමට සමත් අභීත වීරත්වයක් ජන්මයෙන් ම උරුම කරගෙන සිටි ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙක් වර්ෂ 1864 සැප්තැම්බර් මස 17 වැනි දින උපත ලැබී ය. ජාතියේ පිනෙන් පහළ වූ එම උදාර යුග පුරුෂයා අනගාරික ධර්මපාල ශ්‍රීමතාණෝ ය.

එතුමා, මාතර හිත්තැටියේ දෙන් කරෝලිස් හේවාවිතාරණ මැතිතුමා ගේ හා මල්ලිකා ධර්ම ගුණවර්ධන මැතිණිය ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය යි. ධර්මපාලතුමාට මව්පියන් තැබූ නම දෙන් ඩේවිඩ් හේවාවිතාරණ යි. මෙතුමාට බාල එඩ්මන්, සයිමන්, චාර්ලිස් යනුවෙන් සොහොයුරෝ තිදෙනෙක් හා සොහොයුරියෝ දෙදෙනෙක් සිටියහ. දෙන් ඩේවිඩ් හේවාවිතාරණ දරුවා වර්ෂ 1872සිට 1874 දක්වා බැප්ටිස්ට් සිංහල පාසලේ ත්,1874 සිට 1876 දක්වා ශාන්ත බෙනඩික් විද්‍යාලයේ ත්, 1876 සිට 1878 දක්වා කෝට්ටේ ක්‍රිස්තියානි විද්‍යාලයේ ත්, 1878 සිට 1883 දක්වා ශාන්ත තෝමස් විද්‍යාලයේ ත් අධ්‍යාපනය ලැබුවේ ය. එම විද්‍යාලවල ඉගැන්වූයේ ක්‍රිස්තියානි ධර්මය යි. ඒ නිසා ම එකී ධර්මය ඉගෙනීමටත්, එහි එන ගීතිකා ගැයුමටත් ඔහුට සිදු විය. මෙසේ ඉගෙනුම ලබන අතරතුර මව්පියන් ගේ තිබූ ධාර්මික බව නිසා ම ඔවුන් ගේ මාර්ගෝපදේශකත්වයෙන් පොහොය දිනවල විහාරස්ථානයට ගොස් උපෝසථ අෂ්ටාංග සීලය සමාදන්වීම ද හෙතෙම ඉතා උනන්දුවෙන් සිදු කළේ ය.

## මහා යතිවරුන් ගේ ඇසුර

පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, පූජ්‍ය හෙයියන්තුඩුවේ දේවමිත්ත හිමි යන ධර්මධර තෙරවරුන් ගේ ඇසුරෙන් බුද්ධ ධර්මය හා බෞද්ධ වත් පිළිවෙත් පිළිබඳ ව ඔහු උසස් අවබෝධයක් අත්කර ගෙන සිටියේ ය. මෙම විහාරස්ථාන හා පැවති සමීප ඇසුර ඔහු ගේ ජීවිතය වෙනස් මඟකට යොමු කරවීමට මං පෙත් විවර කළේ ය.

ලංකාවේ ඉපදුණ සිංහලයින් විදේශීය භාෂා හා ක්‍රිස්තියානි ධර්මය ඉගෙන ගෙන පරගැති වහල් මානසිකත්වයක් ගොඩනඟා ගෙන භික්ෂූන් වහන්සේලාටත්, බුදු දහමටත් චෝදනා කරමින් බුදු දහමේ අඩුලුහුඩුකම් ඇති බව පෙන්වා දෙමින් නිර්දය ලෙස විවේචනය කිරීම මෙකල ප්‍රසිද්ධියේ ම සිදු කෙරිණි.

## ඕල්කට් තුමාගේ පැමිණීම

ඒ පිළිබඳ වූ බෞද්ධ හා අබෞද්ධ වාද විවාද රාශියක් ද තැනින් තැන පැවතිණ. පංච මහාවාද ලෙස වඩාත් ප්‍රකට ව ඇත්තේ එම ප්‍රධාන වාද පහයි. මේ අතර වර්ෂ 1873දී ඇති වූ පානදුරාවාදය එකල වඩාත් ප්‍රසිද්ධියක් ඉසිලී ය. වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද නා හිමියෝ වාදයෙහි පැවති මනා දක්ෂතාව නිසා ම ක්‍රිස්තු භක්තිකයන් හා තෙදිනක් වාද කොට ඔවුන් ගේ සියලු තර්ක බිඳ හෙළා පරාජයට පත් කළහ. පානදුරාවාදය ආදී වාදවලින් ලංකාවේ බෞද්ධයන් ජයග්‍රහණය කළ ඓතිහාසික පුවත ලංකාවේ පමණක් නොව ලෝකය පුරාම ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කෙරිණි. එහි මා හැඟි ප්‍රතිඵලයක් වූයේ අමෙරිකානු ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා බ්ලැවැට්ස්කි මැතිණිය නම් වූ රුසියානු ජාතික කාන්තාවක සමඟ ලංකාවට පැමිණීම යි.

## සරසවි සඳරුැසේ ආරම්භය

එවැනි පසුබිමක් යටතේ ලංකාවට සැපත් ඕල්කට්තුමා ගාල්ල විජයානන්ද පිරිවෙන් විහාරස්ථානයේ දී තිසරණ සහිත පන්සිල් සමාදන් ව බුදු දහම වැළඳ ගත්තේ ය. ඉක්බිති ව ලංකාවේ දේශ හිතෛෂී ශාසන මාමක පිරිස් සමඟ එකතු ව “පරම විඥනාර්ථ බෞද්ධ සංගමය“ ස්ථාපිත කළේ ය. “සරසවි සඳරැස“ නම් පුවත්පත ආරම්භ වූයේ ද එහි ප්‍රතිඵලයක් ලෙස යි. තැනින් තැන සිදු කළ ඕල්කට්තුමා ගේ දේශන අසා ඒ කෙරෙහි බෙහෙවින් ම ප්‍රසාදයට පත් ඩේවිඩ් තරුණයා දිගින් දිගට ම එතුමා සමඟ එක්ව ජාතික ආගමික කාර්යයන් හි නිරත වූයේ ය.

## නම වෙනස් කිරීම

වෙසෙසින් රටේ ඒ ඒ ප්‍රදේශයන් හි ගමන් කරමින් ඕල්කට්තුමා ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කළ දේශන එතුමා සිංහල භාෂාවට පරිවර්තන ය කළේ ය. මෙතැන් පටන් ‘ඩේවිඩ්“ යන විදේශීය නම ඉවත් කොට ‘අනගාරික ධර්මපාල‘ යන බෞද්ධ නම භාවිත කිරීමට එතුමා තීරණය කළේ ය.

ඕල්කට්තුමා ත්, අනගාරික ධර්මපාලතුමා ත් ප්‍රමුඛ මෙම සත්පුරුෂ විද්වත් පිරිස අප රටේ දරුවන්ට මිෂනාරි අධ්‍යාපනය වෙනුවට බෞද්ධ අධ්‍යාපනයක් ලබා දිය යුතු ය, යන අරමුණ ඇතිව ක්‍රියා කළ හ. ඒ වෙනුවෙන් රටේ විවිධ ප්‍රදේශවල විශේෂ රථයකින් ගමන් කරමින් එම රථයේ ම රාත්‍රිය නිදා ගනිමින් රටේ ජනතාව දැනුවත් කිරීමට කළ කැප කිරීම ඉතා විශිෂ්ඨ ය.

## සිංහල බෞද්ධ අධ්‍යාපනයේ හිමිකම

මෙකී රථයේ ‘ගෙරි මස් නොකව්‘ යනුවෙන් ලොකු අකුරින් සඳහන් කොට තිබිණ. ගව මස් කෑමට හා සුරා පානයට දැඩි ලෙස විරුද්ධ ව ක්‍රියා කළ ධර්මපාලතුමා ගේ දේශන ඉතා දැඩි ස්වරයක් ගත්තේ ය. ඒ සිතේ පැවති දරුණු ස්වභාවයක් නොව අපේ බෞද්ධාගමටත්, ජාතියටත් තිබූ අව්‍යාජ අවංක භක්තිය හා ගෞරවය යි. මෙසේ කල්යත් ම ඕල්කට්තුමා සමඟ එක්ව මිෂනාරීන්ගේ නොමනා අධ්‍යාපනය වෙනුවට බෞද්ධ දරුවන්ට යෝග්‍ය අධ්‍යාපනයක් ලබා දීමේ උදාරාධ්‍යාශයෙන් “ඉරිදා පාසල්“ ආරම්භ කළේ ය. අද කොළඹ ආනන්ද විද්‍යාලය නමින් ප්‍රකට ව ඇත්තේ එසේ ආරම්භ කළ ඉරිදා පාසලකි. පරම විඥනාර්ථ සමාගම මඟින් කෙටි කලක් තුළ පාසල් පනහකටත් වැඩි ප්‍රමාණයක් ආරම්භ කරන ලදී. අප රටේ දරු දැරියන්ට සිංහල බෞද්ධ අධ්‍යාපනයක් ලැබීමේ හිමිකම උරුම වූයේ ඒ අනුව යි

## බුද්ධගයාව බේරා ගැනීම

වරෙක අනගාරික ධර්මපාලතුමාට ජපන් ජාතික භික්ෂූන් වහන්සේ නමක සමඟ දඹදිව චාරිකාවක යාමට අවස්ථාව උදා විය. ඒ බෞද්ධයන් ගේ පරම වාසනා මහිමයකට ය. ඒ වන විට “මහන්තා“ නම් හින්දු පූජකයෙක් බුද්ධගයා භූමිය අත්පත් කරගෙන එය ස්වකීය අණසක යටතේ පාලනය කරගෙන ගියේ ය. එදා සම්මත ව පැවතියේ එම බුද්ධගයා භූමිය බෞද්ධයන්ට නොව හින්දූන්ට අයිති දෙයක් බව යි. මේ පිළිබඳ දැඩි සේ කම්පාවට පත් ධර්මපාලතුමා “කවදා හෝ මා මේ බුද්ධගයාව බේරා ගන්නවා“ යන අධිෂ්ඨානය ඇති කර ගත්තේ ය.

එහි මා හැඟි ප්‍රතිඵලයක් ලෙස “සිංහලයිනි, නැගිටිවු. බුද්ධගයාව බේරා ගනිමු“ යන ආදර්ශ පාඨය මඟින් සිංහලයන් පුබුදුවා ලෝකවාසී බෞද්ධයන්ගේ ද සහාය ලබා ගෙන දැඩි පරිශ්‍රමයක් දරා දඹදිව බුද්ධගයාව ප්‍රමුඛ සෙසු සිද්ධස්ථානයන් හි උරුමය බෞද්ධයනට ලබා ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සම්පූර්ණ කළේ ය. එතුමා ගේ එම අත්‍යුදාර සේවාවට පින් සිදු වන්නට අද අප සේ ම ලෝක වාසී බෞද්ධ ජනතාව ද නිදහසේ ගොස් දඹදිව සිද්ධස්ථාන වන්දනා කරති. එතුමා පහළ නොවන්නට බුද්ධගයාව නාම ශේෂ බවට පත්වනු නො අනුමාන ය.



# විඩාබර ගමනට විරාමයක් ලබන හැටි



**නපුරු සිතිවිලි සිතන, නපුරු වචන කියන, නපුරු ක්‍රියාවන් හි නිරත තැනැත්තා බාලයෙකි. එසේත් නැති නම් අනුවණයෙකි. නපුරු සිතිවිලි සඳහා අභිධ්‍යා, ව්‍යාපාද, මිත්‍යාදෘෂ්ටි යන ත්‍රිවිධ මනෝ දුශ්චරිතයන් ද, මුසාවාද, පිසුනාවාච, ඵරුෂාවාච, සම්ඵප්‍රලාප යන චතුර්විධ වචී දුශ්චරිතයන් ද, ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන තෙවැදෑරුම් කාය දුශ්චරිතයන් ද යන දස අකුසල ක්‍රියාවන් හි යෙදී සිටින්නා බාලයා යනුවෙන් ධර්මයෙහි හඳුන්වනු ලබනවා.**

මේ ලක්ෂණ බාලයා ගේ ප්‍රකට ස්වරූපය යි. ඔහු ගේ චරිත ස්වභාවය යි. අනන්‍යතාව යි. බාලයා වරද, වරද වශයෙන් පිළිගන්නේ නැත.එ පමණක් නොව තම වරද දකින්නේ වුව ද එය සකසා ගන්නේ නැත. අන්‍යයන් වරද පෙන්වා දුන් විටෙක දී පවා එය තරයේ ප්‍රතික්ෂේප කිරීම අනුවණයා ගේ තවත් ප්‍රකට ලක්ෂණයන් සේ දහමෙහි දැක්වේ.

බුදු දහමෙහි අනුවණකම එසේ හඳුන්වා දෙන අතර ම එවැනි අය තම ඇසුරින් දුරින් දුරු කිරීමට ද උපදෙස් දෙමින් සාංසාරික ජීවිතය පිළිබඳව ද බොහෝ තොරතුරු අනාවරණය කරන අයුරු දැකිය හැකි ය. තථාගතයන් වහන්සේ විසින් දේශනා කොට ඇත්තේ නිවන් දක්නා තෙක් නො සිඳී, නො කැඩී, අවිච්ඡින්න ව පාරම්පරික පැවැත්ම සංසාරය යනුවෙනි. මෙහි 'නොසිඳෙන පරම්පරාව' යන යෙදුමෙන් අදහස් කරන්නේ ස්බන්ධ ධාතු ආයතනයන් ගේ අඛණ්ඩ වූ චිර පැවැත්මයි. දිගින්දිගට ම දිව්‍ය, මනුෂ්‍ය, අසුර, යක්ෂ, රාක්ෂ, නාග, ස්ත්‍රී, පුරුෂ ආදී විවිධ නම් ලබමින් පැවැතගෙන යැම සංසාරය නම් වනවා. මෙබඳු වූ සසර පිළිබඳ සඳහන් කිරීමේ දී එහි ඇති බියකරු බව දහමින් සරලව පෙන්වා දී ඇත්තේ එය ඕඝයක් හෙවත් සැඩ පහරකට උපමා කරමින්.

බුදුරජාණන් වහන්සේ හැඳින්වීම සඳහා වන තිලෝගුරු යන විශේෂණ යෙදුමෙන් අදහස් කරන්නේ, උන්වහන්සේ තිලොවට ම අසහාය මඟ පෙන්වීම සිදු කරන උත්තම ආචාර්යවරයාණෝ වන බවයි. තම ශ්‍රාවකයන්ට හෙවත් ශිෂ්‍යයන්ට ධර්මාවබෝධය සඳහා තමන් වහන්සේ ගේ සුවිශේෂී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා විවිධ ක්‍රමෝපායන් භාවිත කොට ගෙන තිබේ. ඒ අතර ශ්‍රව්‍ය හා දෘෂ්‍ය උපකරණ මෙන් ම උපමා උපමේය භාවිතය ද දක්නට ලැබේ.උන්වහන්සේ තම ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගෙන ඇති එම උපමා රූපක කිසිවකුටත් නුහුරු නුපුරුදු ඒවා නොවේ. සියල්ල ම පාහේ තම ඇසට පෙනෙන මානයේ පවතී. ශාරීරික ව තමන් අත්විඳිමින් සිටී. එබඳු ඉගැන්වීමක් ධම්මපද පාලියට අයත් මෙම ගාථා ධර්මයෙන් ද දැක ගත හැකි ව තිබේ.

**දීඝා ජාගරතො රත්ති**
**දීඝං සන්තස්ස යෝජනං**
**දීඝෝ බාලානං සංසාරෝ**
**සද්ධම්මං අවිජානතං**

'ජාගරතො' සහ 'සන්තස්ස' යන වචන ව්‍යවහාර බසට නැඟීමේ දී පැහැදිලි වන්නේ 'නිදිවැරීම' සහ 'ගමන් විඩාව' යන තේරුම්වලිනි. රාත්‍රියෙහි ඇතැම්විට නින්ද නොයැම නිසා පීඩාවට පත් නොවූ කෙනෙක් සොයා ගැනීම දුෂ්කර ය. එබඳු බොහෝ අවස්ථාවන්ට අපි ද මුහුණදී ඇත්තෙමු. එහි දී විඳ ඇති අපහසුතාවන් අත්දැකීමෙන් ම දනිමු. රාත්‍රියෙහි ස්වභාවික ව ලැබෙන නින්ද යම් යම් හේතූන් නිසා නොලබන, රෝගී බවට පත් බොහෝ දෙනා ඒ සඳහා ඖෂධ ලබා ගන්නේ ද ඒ නිසාවෙනි. එබඳු පීඩාකාරි වූ මෙම සුලභ අත්දැකීම සංසාරයෙහි ඇති පීඩාකාරි ස්වභාවය හැඟවීම සඳහා ඉතා සමීපතාවයක් ගෙන දෙයි. එපමණක් නොව එහි ඇති පීඩාකාරී වූත්, අප්‍රසන්න වූත්, වෙහෙසකාරි වූත්, කටෝරදායි වින්දනය සත්වයාට සසර පිළිබඳ කිසියම් අත්දැකීමක් ලබා දීමට යොදා ගෙන ඇති අයුරු තථාගත ධර්මයෙහි අව්‍යාජ බව පෙන්නුම් කරන්නකි.


එසේ ම සසර ස්වභාවය පිළිබඳ සරල දැනීමක් ඉක්මනින් ඇති කිරීම සඳහා මෙහි අනෙක් උපමාව වූ 'සන්තස්ස' යන වචනය හේතු වේ. තථාගතයන් වහන්සේ ධරමාන කාලයේ බොහෝ විට ගමන් බිමන් ගියේ පා ගමනිනි. ගැල් සහ අශ්ව කරත්ත ආදී විවිධ ප්‍රවාහන ක්‍රම තිබුණ ද අද මෙන් පොදු මගී ප්‍රවාහන ක්‍රම තිබුණේ නැත. අශ්ව කරත්ත බහුල වශයෙන් භාවිත කරන්නට ඇත්තේ රජවරු, සිටුවරු ආදී ප්‍රභූ ජනයා විය හැකි ය. ඒ අනුව යොදුන් ගණන් පා ගමනින් යන බොහෝ සාමාන්‍ය ජනතාව භාග්‍යවතුන් වහන්සේට ද මුණගැසුණි. එක්ව ගමන් කිරීම් ද සිදුවන්නට ඇත. එසේ බොහෝ වෙහෙස දරමින් කුඹල්හල් ආදී විවිධ නවාතැන් හි නතර වෙමින් දින ගණන්, සති ගණන් තමන් අපේක්ෂිත ස්ථාන කරා යාමට පීඩාකාරී ව වෙහෙස විඳිමින් මහ මඟ ගමන් ගන්නා පිරිස් තථාගතයන් වහන්සේට බොහෝ සෙයින් මුණගැසී තිබෙන්නට ඇත. එසේ විඩාබරිත ව යන පුද්ගලයන් තමන් අත්විඳින වේදනාකාරි බව නිසා ම ඉදිරියට ඇති දුර මුණගැසෙන අයගෙන් විමසන්නට විය. එම විඩාබරිත මගියා මෙන් සත්වයා සාංසාරික ගමන් මඟෙහි තැන තැන නතර වෙමින් නැවත නැවතත් ගමන් කරයි. එහි ඉමක් නොදකියි. එය ශ්‍රාවක මනසට ළංකිරීම සඳහා තථාගතයන් වහන්සේ ජන මනසට ඉතා සමීප රූපකයන් භාවිත කොට ඇති අයුරු දැක ගත හැකි ය.

සමහරු ධර්මය නොදනිති. තවත් සමහරු දැන දැනත් නොදන්නාක් මෙන් ක්‍රියාකරති. එමෙන් ම ධර්මය විකෘති කරන අනුවණයන් ද වෙති. ඔවුන් ගේ සසර ගමන ද, නිදිවරන්නාට රැය පීඩාකාරී ව දික්වන්නාක් මෙන්, විඩාබර මගියාට ගමන් මඟෙහි දුර ප්‍රමාණය දික්වන්නා මෙන් දිගු වන බව පැහැදිලි කොට ඇත.

මෙහි 'සද්ධම්මං' යන වචනයෙන් කියැවෙන්නේ උතුම් තථාගත ධර්මය යි. මෙහිදී මූලික වශයෙන් අර්ථ ගන්වා ඇත්තේ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් ය. ඒවා පංචින්ද්‍රිය, පංචස්කන්ධ, සතර සතිපට්ඨාන, සතර සම්මප්ප්‍රධාන, සතර ඉද්ධිපාද, පංචබල, සත්ත බොජ්ඣංග මෙන් ම ආර්ය අෂ්ඨාංගික මාර්ගය යනුවෙන් සංඛ්‍යාත්මක ව දැක්වා ඇත. එබඳු වූ උතුම් ධර්මය නොදැනීම අනුවණයා ගේ ලක්ෂණය වන්නා සේ ම සසරමඟ දික්වන්නේ ය යන්න මෙම දේශනාවෙහි අදහස යි.

තථාගතයන් වහන්සේ ගේ මෙම දේශනය සඳහා හේතුවී ඇත්තේ කොසොල් රජු ය.දිනක් රජතුමා ඇතු පිටින් නුවර සැරිසරන අවස්ථාවේ නගර වැසි එක්තරා රූමත් ස්ත්‍රියක් දුටුවේ ය. රජුට ඇය සමඟ සහවාස වීමේ ආශාවක් ඇති විය. තොරතුරු සොයා බැලීමේ දී ඇය විවාහක කතක් බව දැන ගත් රජු එම ස්වාමියා විනාශ කොට ඇය ලබා ගැනීමට සිතුවේ ය. ඒ අනුව සොයා ගත නොහැකි යැයි සම්මත කිසියම් මල් වර්ගයක් හා මැටි වර්ගයක් සොයා ගෙන පැමිණීමට ඔහුට නියම කළේ ය. ඒවා ලැබිය යුතු වේලාව ද නියම කෙරුණි. රජ අණ ඉටු නොකිරීම මරණ දඬුවමට හේතු වන බැවින් එම අසරණ මිනිසා නගරයෙන් ඈතට ගියේ ය. ගඟක් අසබඩ නතර ව ආහාර දානයක් දෙමින් සිදු කළ සත්‍ය ක්‍රියාවකින් පසු එම දුර්ලභ පුෂ්පයන් වූ කඩුපුල් මල් හා අරුණුවන් මැටි විශ්මිත ආකාරයකින් ලබා ගත හැකි විය. රජ අණ ඉටු කරමින් නැවත ලහි ලහියේ රජ මැදුරට පැමිණියේ ය. එහෙත් රජ මැදුරට ඇතුළු විය නොහැකි වුණි. රැගෙන පැමිණි දෑ කිසියම් තැනක තබා තම රැකවරණය පතා හෙතෙම දෙව්රම් වෙහෙරට පැමිණියේ ය. ඉහත රූමත් ස්ත්‍රිය සමඟ එක්වීමේ කාම කල්පනාව නිසා රජු ගේ අසලකටවත් නින්ද නොපැමිණියේ ය. නිදිවරමින් එම ස්ත්‍රියගේ රුව ගුණ ගැන සිතමින් සිටි රජතුමාට මැදියම් රැයේ දී "දුසනසෝ" යනුවෙන් බියකරු හඬක් ඇසුණි. බොහෝ බියට පත් රජු උදෑසන ම තැතිගත් සිතින් හා බියෙන් සැකයෙන් යුතු ව තථාගතයන් වහන්සේ මුණගැසුණි. තථාගතයන් වහන්සේ දේශනා කරන ලද්දේ කාමයෙහි වරදවා හැසිරීම නිසා අපායගත ව සිටින සිටුවරු සිව් දෙනෙක් ලෝකුම්භ නරකයෙහි පැසෙමින් නිරය මුවවිටට පැමිණි විටෙක ඔවුන්ගෙන් ප්‍රකාශ වූ සෝකාලාපයක් බව යි. එය ඔබට හෝ රාජ්‍යයට හානියක් නොවන බවයි. නිදිවරන්නාට රැයත්, විඩා ඇත්තාට යොදුනත් දික්වන්නා සේ ම, ධර්මය නොදත් අනුවණයාට සසර දික්වන බව යි. එයින් බියපත් වූ රජු කම් සැපයෙහි ගිජුකම හැර දැමූ බව සඳහන් වේ.

මෙම සියලු කරුණු සැලකිල්ලට ගනිමින් විඩාබර දිගු සසර ගමන කෙටිකර ගැනීම සඳහා උත්සාහ ගත යුතු ව ඇත.



කොළඹ 06
හැව්ලොක්සිටි සාම විහාරාධිපති
**අතපත්තුකන්දේ ආනන්ද නා හිමි**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

බිනර පුර අටවක 2021.09.13

## සිත ලෙඩ කර ගන්න එපා

නිරෝගී බව සම්පතකි. එහෙත් එහි අගය බොහෝ දෙනකුට වැටහෙන්නේ රෝගී ව විඳවන්නට වූ කල ය. රෝහල්වලට ම කාලය ගත කරමින් අමාරුවෙන් උපයා ගත් මුදලත් ඒ සඳහා වියදම් කරන්නට වූ විට ය. කරන්නට ඇති දහසකුත් වැඩ කටයුතු ගොඩගැසෙන්නට වූ කල ය. තමන් ආරක්ෂාකාරී සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කළා නම් රෝගී බවින් වැළකෙන්නට තිබුණා යැයි බොහෝ දෙනෙක් එවැනි අවස්ථාවන් හි පසුතැවෙන ආකාරය ද පෙනේ. අද අප මුහුණ දෙන වසංගත තත්වය ම උදාහරණ කොට ගත හැකි ය. නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය නොකිරීම නිසා බොහෝ දෙනෙක් රෝගය වැළඳී පීඩාවට පත් විය. මරණය වැළඳ ගත්හ. ගිය නුවණ ඇතුන් ලවා වත් අද්දවන්නට බැරි යැයි කියමනක් තිබේ. එසේ නම් කළ යුතු නැවත එවැනි මඟ හැරීම් නොවන තැනට කටයුතු කිරීම ය.

අවධානය යොමු කළ යුතු තවත් කරුණක් තිබේ. නිරෝගී බව කී සැණින් බොහෝ දෙනකුගේ සිතට නැගෙන්නේ කායික නිරෝගී බව ගැන ය. එහෙත් ශරීරය මෙන් ම සිත ද සමබර විය යුතු ය. මනස ලෙඩ වෙලා නම් කායික ව මොන තරම් ශක්ති සම්පන්න වුව ද පලක් නැත. ඔහු රෝගියෙකි.


කය අපිරිසුදු වූ බව දැන ගත් වහා ම පිරිසුදු ජලයෙන් සෝදා හරින්නට අපි වහ වහා උත්සුක වෙමු. ඒ අපිරිසුදු බව දරා ගත නොහැකි නිසාත්, අපිරිසුදුකම නිසා රෝගී වීමට ඉඩ ඇති නිසා ත් ය. කුණු දුහුවිලි වැකී සිරුර අපිරිසුදු වූ විට අපට එය හොඳින් දැක බලා ගැනීමට ද හැකි ය. දුර්ගන්ධය ද දැනෙන්නේ ය. අප වහාම පිරිසුදු වන්නට ක්‍රියාත්මක වන්නේ ඒ අනුව ය. එහෙත් සිත අපිරිසුදු වූ විට අපට නොපෙනේ. දුර්ගන්ධයක් නොදැනේ. ඒ නිසා සිත පිරිසුදු කළ යුතු බවට උවමනාවක් නොදැනේ. කරදරයේ වැටෙන්නේ ඒ අනුව ය.

සිත අපිරිසුදු වී තිබේද යන්න දැන ගන්නට නම්, සිත දකින්නට උත්සාහ කළ යුතු වේ. සිතිවිලි හඳුනා ගන්නට උත්සාහ කළ යුතු වේ. අනුන් කෙරෙහි වන වෛරී සිතිවිලි දරා ගන්නට බැරි තරම් සිත, පීඩාවට පත් ව ඇත් නම් ,අනුන්ට විපතක් කරන්නේ කෙසේදැයි සිතිවිලි මෙහෙයවනවා නම්, ඒ සිත රෝගී ය. අනුන්ට ලැබෙන දේ දරා ගන්නට බැරිව ඊර්ෂ්‍යා කරනවා නම් ඒ සිත රෝගී ය. අනුන් පාගා දමන්නට සිතිවිලි මෙහෙයවනවා නම්, ඒ සිත රෝගී ය. අධික ලෝභය වේ නම්, ද්වේශය, මෝහය වේ නම් ඒ පුද්ගලයා ද රෝගී ය. මේ කෙලෙස් අඩු වැඩි වන තරමට රෝගී තත්ත්වය ද උත්සන්න වන්නේ ය. අනුන් ගැන සිතමින්, ආශාවන් ගැන සිතමින් වැරැදි ආකාරයේ කවර සිතිවිල්ලක් වුව ද ඇති කර ගන්නේ නම් ඒ රෝගී බවින් විඳවන්නට වන්නේ තමන්ට ම ය. එහෙයින් මනස අපිරිසුදු කරන කෙලෙස් කසට දුරු කිරීමට උත්සාහ කළ යුතු ය.

රෝගී සිතකින් අයහපත් දේ ම මිස යහපත් දෙයක් කරන්නට පෙළඹෙන්නේ නැත. ඒ අනුව තව තවත් රැස් වන්නේ ද කෙලෙස් කසට ම ය. සිත නිරෝගී කර ගැනීමට නම් අයහපත් සිතිවිලි වැඩෙන්නට නොදී සිත ආරක්ෂා කර ගත යුතු ය. අයහපත් සිතිවිල්ලක් ඇති වන වහා ම ඒ ගැන සිතා යහපත් දේ ම සිතිය යුතු ය. ඒ සඳහා වූ අපූර්ව මාවතක් ශ්‍රී සද්ධර්මය අපට උගන්වා තිබේ. කළ යුතු ඒ දහම ප්‍රායෝගික ව තමන්ගේ සිතට පුරුදු කිරීම ය. ඒ පුරුදු මේ ජීවිතයේ පමණක් නොව, සසර පුරා ද අප පසුපස එනු ඇත.

## සිහියෙන් හා උත්සාහයෙන් කටයුතු කරනවා නම්

# වසංගත රෝගයෙන් බේරෙන්නට පුළුවන්



ශාස්ත්‍රපති
**වාද්දුවේ ධම්මවංස හිමි**
ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ නිකාය සංවර්ධන සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශ්‍රී ලංකාරාමය වාද්දුව



අද ලෝකයේ දරුණුතම වසංගතය, කොවිඩ් වසංගතය යි. ඉතාම සියුම් ව පැතිරෙන

මෙම වෛරසය මෙතෙක් ලොව පහළ වූ සියලු වසංගත රෝග ව්‍යාප්තිය ඉක්මවා තිබෙනවා. සෞඛ්‍ය අධ්‍යාපනය මෙ තරම් දියුණු නො වූ කාලවල මතු වූ වසංගත රෝග නසාලීමට තත්කාලීන වෛද්‍ය ක්‍රමවලට හැකියාව තිබුණ ත් මේ සා ප්‍රභේද වලට පත් වෙමින්, හෙමින් හැඩ ගැසෙමින් බහුල ව ව්‍යාප්ත වූ වෛරසයක් පෙර නොවූ බව තතු දන්නා අය ගේ ප්‍රකාශ වලින් හෙළි වෙනවා.

වෙදකමට වඩා හෙදකම වටිනවා යැයි කියමනක් තිබෙනවා. එමෙන් ම නිවාරණය සනීප වීමට වඩා හොඳ බව වෛද්‍යවරු නිතර පවසනවා. මේ කොයි ආකාරයෙන් කීවත් අවධාරණය කරන්නේ මානසික ඒකාග්‍රතාව , සිහිය සහ උත්සාහය තිබෙනවා නම් රෝගී නොවී සිටිය හැකිබව යි.

ලොව රටවල සියලු පාලකයෝ රෝගය වැළැක්වීමට වෛද්‍ය උපදෙස් ලබා දෙනවා. ශ්‍රී ලංකාව මෙම කාර්යය ඉතා මැනවින් ඉටු කරනවා. රෝගයෙන් බේරා ගැනීමටත් , රෝගය වළක්වා ගැනිමටත් රජය සහ සෞඛ්‍ය සේවා සිදු කරන උසස් සේවය අද්විතීය යි. මැදහත් ව සිතන්නෝ එසේ දකිනවා.

කොවිඩ් 19 ප්‍රභේද නො වූ මුල් ම වෛරස ගැන දැන ගත් දා සිට ම වෛද්‍යවරු, රෝගය නොවැළඳීමට නම් දෑත් සේදීම, මුඛ ආවරණ භාවිතය , සංචරණ සීමා හා නිතර පිරිසිදුවීම මැනවින් දැන ගත යුතු බව ප්‍රකාශ කළා. මේ සම්මා දිට්ඨිය යි. සම්මා දිට්ඨිය මෙය යි.

බුදුරජාණන් වහන්සේ දුක පිළිබඳ චතුරාර්ය සත්‍ය දැකීම පමණක් නොව සියලු දුර්වලතා චතුරාර්ය සත්‍ය දර්ශනය පදනම් ව දැකීම ත් සම්මා දිට්ඨිය බව වදාළා. මජ්ඣිම නිකායේ සම්මා දිට්ඨි සූත්‍රයේ සාරිපුත්‍ර මහා රහතන් වහන්සේ ගේ දේශනය මින් එකක්.

වේදනාව දැකීම , වේදනාවේ හේතු දැකිම, වේදනා නිරෝධය දැකීම , වේදනා නිරෝධ මාර්ගය දැකීම සම්මා දිට්ඨිය යි. එසේ කොවිඩ් 19 වෛරස් රෝගය ගැන දැනීම, එය පැතිරෙන හේතු දැන ගැනීම,එහි නිවාරණය දැනිම , ඒ සඳහා මාර්ගය දැකීමයි. මෙය න්‍යාය විරෝධී නොවේ. එබැවින් මේ සරල දැනුම ලබා ගත යුතු වෙයි. කොවිඩ් 19 ගැන විස්තර කරන ඇතැම් දේශකයෝ මුඛ ආවරණය තල්ලට දමා ගෙන දේශනා කරන ආකාරය ද, මයික්‍රෆෝන රාශියක් ඉදිරිපිට මුඛ ආවරණ නැතිව කථා

කරන ආකාරය ද මාධ්‍යවල දැකිය හැකි වෙනවා. මෙම වෛරසය ඕනෑම තැනක රැඳිය හැකි අතර, එයට

සංචරණ සීමා පැනවිය නොහැකි යි. මහැදුරෝ කළ යුත්තේ මුඛ ආවරණයක් පැළඳ කතා කිරීම යි. ඒ වනාහී

“දබ්බී රූප රසං යථා යැයි දේශනා කළ පරිදි තම ක්ෂේත්‍රයේ ම සිටියත් ‘හොද්දේ රස නොදැනෙන

පොල්කටු හැන්ද’ වැනි ස්වභාවයක් බව බලා සිටින්නන්ට හැඟෙනවා. වඩා වටින්නේ දහසක් දැනුම තිබීම නොව තමා සතු කුඩා දැනුම වුව භාවිතයට ගැනීම යි.

‘සහස්සම්පි චේ ගාථා අනත්ථ පද සංහිතා
ඒක ගාථා පදං සෙය්‍යෝ තං සුත්වා උපසම්මති’

යනු බුද්ධ වචනය යි. දහසක් දේ දැන සිටිනවාට වඩා

එක කුඩා ගාථා පදයක් දැන එය ප්‍රායෝගික ව වැඩීම වටී. කිසිදු භාෂා ශාස්ත්‍ර, විද්‍යාවන් හී නො යෙදෙන අයකුට වුව මේ උතුම් සම්මා දිට්ඨිය ලබා ගත


හැකියි. අරි අට මගේ සම්මා දිට්ඨිය සමඟ පූර්වංග අංග දෙකක් දක්වා තිබෙනවා. ඒ සම්මා සතිය හා වායාම යයි. සතිය යනු සිහිය යි . නිතර අරමුණේ සිහිය පවත්වා ගැනීම සතිය යි. අරමුණ වන්නේ සතර සති පට්ඨානය යි. එහි කායානුපස්සනාවට මුඛආවරණ පැළඳීම යැයි යෙදීම න්‍යාය විරෝධී නොවේ. තමන්

අඩි හයක් පමණ දුරින් සිටීම , නිතර දෑත් සේදීම , විෂහරණයක් ළඟ තබා ගැනිම , වෙළඳසලකින් ලැබෙන කවරයක් හෝ මුදල් හෝ අල්ලා මුහුණ නො අල්ලා සිටීම , මුඛ ආවරණය කෙසේවත් තම අතින් නො ඇල්ලීම, අශාව නිසා වෙළඳසල් හි ඇති භාණ්ඩ අතපත නොගෑම ආදි අපේ සියලුම කායිකචර්යාවන් කායානුපස්සනාවේ සඳහන් සම්පජානකාරී චර්යාවන් වෙයි. අනවශ්‍ය ඔප දූප හා තිරච්ඡීන කථා හෙවත් වල් පල් මඟ දෙපස සිට දෙඩමින් නොසිටීම ද සම්මා වාචා වන අතර, ඒ සඳහා සතිය තිබිය යුතු වෙයි.

සතිය කෙතරම් ශක්තිමත් වුව ද එය සිතින් ගිලිහී යෑම සාමාන්‍යය යි. අවුරුදු 30 ක් ගතපච්ඡාගත ධූතංග අරමුණ වැඩූ හිමි නමක් අලුතින් හමු වූ තවත් පිරිසක් නිසා සිහිය වෙනස් වී, අරමුණ බිඳී ,ඉතා අමාරුවෙන් තමාගේ සිහිය බිඳුන ස්ථානය සොයා ගිය හැටිත්, පසුව ඒ ස්ථානයේ සිට නැවත මෙම ධූතාංගය පිරීම ආරම්භ කළ ආකාරයත් අටුවා කථාවක එනවා. එ බැවින් ‘ධම්මිකා කථා වා තුණ්හීභාවේන වා’ යන කථා කරන්නේ නම් ධාර්මික කථාවක් කරන්න, නො එසේ නම් නිශ්ශබ්ද ව ඉන්න යන බුදු වදන ද සම්මා වායාමය යි.

නිතර සම්මා සතිය පවත්වා ගැනිමට ගන්නා උත්සාහය ම වායාම නම් වෙනවා. එබැවින් මේ පිළිවෙත් පිළිපදින්නට දැඩි උත්සාහයක් ගත යුතු ම වෙනවා.

# අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ ශ්‍රී පඤ්ඤාසීහ මහා නාහිමිපාණෝ



**මෙ සියවස තුළ පහළ වූ, සඟ සසුන් කෙත සඟ රජ සිරි හෙබවූ, මහරගම, සිරි වජිරඤාණ ධර්මායතනාධිකතෘ ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක , අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක අග්ගමහා පණ්ඩිත, විද්‍යා විශාරද අති පූජ්‍ය මඩිහේ ශ්‍රී පඤ්ඤාසීහ මහා නායක මාහිමියන් වහන්සේ ගේ විශිෂ්ට වූ චරිතාපදානයෙන් ලේශමාත්‍ර ගුණයක් මෙයින් ඔබ හමුවට ගෙන එන්නේ උන්වහන්සේ ගේ අපවත් වීමෙන් 2021 සැප්තැම්බර් මස 08 වන දිනට වසර දහඅටක් ගතවීම නිමිත්තෙනි.**

දක්ෂිණ ලංකාවේ මාතර නගරාන්තර්ගත මඩිහ නම් වූ ග්‍රාමවරය උන්වහන්සේ ගේ ජන්ම භූමිය වී ය. භක්ති ප්‍රේමයෙන් යුත් ශුද්ධකුලාභිජාත ජේම්ස් කරොලිස් පූජිත ගුණවර්ධන මහතාණෝ පිය වූ හ. බෙලා ඇන්ජලීනා ධීරසේකර උපාසිකාවෝ දිනිතිය වූ හ. ධීර වීර ගුණ නැණ සමුදායක උල්පතක් හා සමාන වූ මේ චරිත කතා නායකයාණෝ ක්‍රි.ව: 1913 ක් වූ ජූනි මස 21 වැනි දින ටෙනිසන් විල්මට් පූජිත ගුණවර්ධන නමින් මනුලොව දිනූ සේක.

දුටුවන් සිත් වසී කරවන රුචිර වූ දේහ ශ්‍රී සොභාවෙන් හා අනූන වූ ධන්‍ය පුණ්‍ය ලක්ෂණයෙන් ශෝභිත වූ මෙ කුමරුන් කෙළි දෙළෙන් පිනපිනා දෙමාපියන් ගේ සෙනෙහස නමැති කිරි මුහුදට පුරපස සඳ මෙන් නිරුපද්‍රිත ව වැඩෙන්නේ, අකුරු කරවීමට තිසි කල් වයස් පැමිණියෙන් ස්වකීය සහෝදරියන් අධ්‍යයනයෙහි තියුතු ව සිටි සාන්ත තෝමස් ඉංග්‍රීසි විද්‍යාලයට ඇතුළත් කරනු ලැබී ය. එහි දි උපතින් වසර දහයක් පමණ වන තෙක් අධ්‍යයන කටයුතුවල නිරත වූ කුඩා විල්මට් ඉන් අනතුරු ව ස්වකීය පියතුමන් මුල්ගුරු ලෙස කටයුතු කළ මෙතොදිස්ත විද්‍යාලයට ඇතුළත් විය.

කුඩා කල සිට ම මිශ්‍ර ආගමික පරිසරයක හැදී වැඩුණු විල්මට් ස්වකීය නිවසට පැමිණෙන පන්සලේ හාමුදුරුවන් වහන්සේ ගේ සේ ම, පල්ලියේ පාදිලි උන්නාන්සේ ගේ දර්ශනය අමුත්තක් නොවී ය. එහෙත් සංසාරගත පෙරුම් දමක මහිමයෙන් දෝ කුඩා විල්මට් ගේ සිත ඇදී ගියේ පල්ලියට නොව පන්සලට ය. ඒ අනුව ගුණින් නැණින් මෝරන මෙ කුමරු කඹුරුගමුවේ දේවගිරි පුරාණ මහා විහාරස්ථානයේ දී 1926 ජූනි 24 දා තත් විහාරාධිපති ව වැඩ විසූ, සිරිසද්ධම්මජෝතිපාල කවිධජ විනයාචරිය ගෞරවාර්හ වේරගම්පිට රේවත මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ උපාධ්‍යායත්වයෙන් හා ගෞරවාර්හ පැලැනේ ශ්‍රී වජිරඤාණ මහා නාහිමිපාණන් වහන්සේ ගේ ආචාර්යත්වයෙන් , මඩිහේ පඤ්ඤාසීහ , නමින් පැවිදිදිවියට ඇතුළත් විය. ස්වකීය උපාධ්‍යායන් වහන්සේ ගේ පා සෙවනෙහි උගත යුතු මූලික පිරිත් බණ දහම් ආදිය මාස හයක් පමණ ප්‍රගුණ කළ නවක සාමණේරයන් වහන්සේ ස්වකීය ආචාර්යපාදයන් වහන්සේ ගේ කැඳවුම පරිදි බම්බලපිටියේ වජිරාරාමයේ නේවාසික වීම සඳහා අගනුවරට වැඩම කළහ. එහි දී කුඩා පඤ්ඤාසීහ සාමණේරයන් වහන්සේ ගේ ආරක්ෂකයා වූයේ උගත් ධර්මධර, විනයධර විචිත්‍ර ධර්මකථික මාහිමි නමකි. මෙහි දී පැලැනේ වජිරඤාණ මහා නාහිමියන් පිළිබඳ යමක් සඳහන් නොකළ හොත් එය අඩුවකි. ඒ දේශීය විදේශීය ධර්මදූත ව්‍යාපාරය සඳහා සාකල්‍යයෙන් ම උචිත දේශක පිරිසක් බිහිකිරීමේ ගෞරවය ලැබිය යුත්තා උන්වහන්සේ වන බැවිනි. වජිරාරාම සම්ප්‍රදාය හඳුන්වාදුන් උන්වහන්සේ ලෝක ප්‍රකට ධර්ම දේශකයන් වහන්සේ ලෙස නමක්දිනූ වජිරාරාමවාසී නාරද, පියදස්සී, මෙතෙය්‍ය, සෝම, කෙමින්ද වැනි යතිවරයන් වහන්සේ බිහිකළා සේ ම අම්පිටියේ රාහුල, කඹුරුගමුවේ මහානාම, දෙණිපිටියේ සුමනසිරි වැනි තවත් දක්ෂ පක්ෂ සිසු පිරිසක් ඇති කළහ.

අගනුවරට සැපත්දිනයේ සිට ම පැලැනේ මහා නාහිමි සෙවණේ බණ දහම් සේ ම ගුණ දහම් හදාළ පඤ්ඤාසීහ සාමණේරයන් වහන්සේ විසි වයස් සම්පූර්ණ ව උපසම්පදාර්හ ව සිටි හෙයින් වර්ෂ 1933 දී පැලැනේ ගංගාරාමස්ථ උදකුක්ඛේප සීමාමාලකයේ දී ගෞරවාර්හ වේරගමපිට සිරි රේවත මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ උපාධ්‍යායත්වයෙන් සහ ගෞරවාර්හ පැලැනේ වජිරඤාණ, පොල්වත්තේ ධම්මතිලක, අහංගම පඤ්ඤාලෝක යන මාහිමිපාණන් වහන්සේ ගේ කර්මාචාර්යත්වයෙන් උපසම්පදාව ලැබූහ.

උපසම්පදාවෙන් පසු උසස් අධ්‍යාපන කටයුතු සඳහා ද යොමු වූ උන්වහන්සේ ප්‍රාචීන භාෂොපකාර සමාගම මගින් පැවැත් වූ පරීක්ෂණවලට ස්වොත්සාහයෙන් පෙනී සිටි අතර වර්ෂ 1941 දී මහාචාර්ය ජී.පී. මලලසේකර සූරීන් විසින් ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙහි ආරම්භ කරන ලද, විද්‍යා විශාරද උපාධි පාඨමාලාවට පෙනී සිට 1944 දී පවත්වන ලද එහි අවසාන පරීක්ෂණයෙන් උත්තීර්ණ ව විද්‍යා විශාරද, උපාධිය ලැබී ය.

උසස් අධ්‍යාපන කටයුතු අවසන්වීමත් සමඟ ආගමික, සමාජීක, සංස්කෘතික මහ මෙහෙවර උදෙසා ස්වකීය දායකත්වය දැක්වීම සඳහා උත්සුක වූ උන්වහන්සේ ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා ඉන්දියාව – නේපාලය, චීනය, හොංකොං ආදී රටවල සංචාරය කළ අතර වර්ෂ 1953 දී බුරුමයෙහි පවත්වන ලද – ඡට්ඨ සංගායනාව සඳහා ශ්‍රී ලාංකික නියෝජිත පිරිසේ සාමාජිකයකු ලෙස ද සහභාගී විය. 2500 බුද්ධ ජයන්තියට සමගාමී ව, මහාචාර්ය ජී.පී. මලලසේකර සූරීන් ගේ මෙහෙයවීම මත, සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය මගින් පිහිටුවන ලද බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවෙහි සාමාජික තනතුරකට පත්කර ගනු ලැබූ විද්‍යා විශාරද මඩිහේ පඤ්ඤාසීහ ස්වාමීන්ද්‍රයන් වහන්සේ මුළු රට පුරාම සංචාරය කරමින් බෞද්ධ ප්‍රභූන් ඇතුළු එකී සමිති සමාගම්වල සාමාජික සාමාජිකාවන් හමුවෙමින් ඔවුන් ගේ ප්‍රශ්න පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා ගත්හ. පසු කාලීන ව මහා නාහිමියන් නිතර ප්‍රකාශ කළ, මිනිසා හදා ගම හදමු. ගම හදා රට හදමු, යන තේමා පාඨයට මෙකී සංචාරය උන්වහන්සේට යම් පිටුබලයක් වන්නට ඇතැයි සිතිය හැකි ය.

2500 බුද්ධ ජයන්තිය නිමිත්තෙන් ශ්‍රී ලංකා ජනරජයේ අනුග්‍රහයෙන් පාලි ත්‍රිපිටක පොත් වහන්සේ හුදී ජනයාට තේරුම් ගැනීමට පහසුවන පරිදි සිංහල භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කිරීමට කටයුතු කළ අතර, එකී ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද මඩිහේ මහා නාහිමියෝ කටයුතු කළහ.

අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක ධුරය හොබවමින් වැඩ සිටි ස්වකීයාචාර්ය ගෞරවාර්හ පැලැනේ වජිරඤාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 1955 සැප්තැම්බර් මස 21 දින අපවත් වූයෙන් හිස් වූ අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායෙහි මහා නායක ධුරය මඩිහේ පඤ්ඤාසීහ ස්වාමීන්ද්‍රයන් වහන්සේට පත්කරන්නට තත් නිකායික වෘද්ධතර නාහිමිවරු පසුබට නොවූහ.

මෙම මහනායක ධුර ප්‍රාප්තිය ධර්මරක්ෂිත මහා නිකාය පමණක් ලැබූ භාග්‍යයක් පමණක් නොව සමස්ත අමරපුර පාර්ශවීයයන් ලැබූ භාග්‍යයක් බව පසක් වූයේ 1956 වර්ෂයේ අගභාගයේ දී බම්බලපිටියේ වජිරාරාමයට වැඩම කළ අමරපුර නිකායෙහි සියලු පාර්ශවවල මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ එකඟතාවයෙන් සමස්ත ලංකා අමරපුර මහාසංඝ සභාව පිහිටුවා ගැනීමේ ඓතිහාසික අවස්ථාවෙනි. එකී සද්කාර්ය උදෙසා මූලික වී ක්‍රියා කළ උන්වහන්සේට පසුව ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක පදවිය ද පිරිනැමී ය.

වර්ෂ 1958 අප්‍රේල් මස 21 වන දින මහරගම සිරි වජිරඤාණ ධර්මායතනය ස්වකීය පැවිදි සහෝදර අම්පිටියේ රාහුල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ද අනුග්‍රහය ලැබ පිහිටූ වී ය. ඒ තුළින් වජිරාරාම සම්ප්‍රදාය චිරස්ථායී වූවා පමණක් නොව දේශීය විදේශීය ධර්මදූත සේවාවෙහි නියැළිය හැකි උගත් තරුණ යතිවරුන් රාශියක් බිහිවිය. ඒ අතර මහරගම ධම්මසිරි නාහිමි, අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත මහා නිකායේ මහා නායක, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, තිරිකුණාමලේ ආනන්ද මහා නාහිමි, අපවත් වී වදාළ ගංගොඩවිල සෝම හිමි, පණ්ඩිත හක්මන සුමනසිරි හිමි, මහාචාර්ය ධම්මවිහාරී හිමි, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, තලල්ලේ චන්දකිත්ති හිමි ආදී යතිවරුන් වෙසෙසින් සඳහන් කළ හැකි ය.

ජාතික ප්‍රශ්නවල දී මඩිහේ මහා නායක මාහිමියන් දැක් වූ අදහස් ඍජු බවින් යුක්ත විය. කිසිවිට කිසිවෙකුට පක්ෂග්‍රාහී නොවූහ. මෙරට යළිත් ධර්ම ද්වීපයක් කිරීමට නම් ජනතාව සිල්වත් ව විසිය යුතු බවත් ඒ සඳහා සතර පොහොය නිවාඩු දින බවට පත් කළ යුතු යැයි යෝජනා කළේ ද එහෙයිනි. හැම ඉරියව්වෙහි ම දුටුවන් ප්‍රසාද කර වූ ශ්‍රමණකල්පය නොඅඩුව පැවැත්තේ ය. අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහාභිධාන අමරපුර මහා නිකායෙහි උත්තරීතර මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 2003 සැප්තැම්බර් මස 08 දින අපවත් වී වදාළහ. උන්වහන්සේ ගේ දහඅට වන ගුණ සැමරුම මේ වන විට රටේ පවතින තත්වය සැලකිල්ලට ගනිමින් මාර්ගගත ක්‍රමයට 2021 සැප්තැම්බර් 12 වන දින රාත්‍රී 7ට අතිපූජ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ගේ සහ පින්වත් සාධූන් ගේ සහභාගීත්වයෙන් සිදු කිරීමට නියමිත ය.

අමරපුර කල්‍යාණිවංශ නිකායේ
මහාලේඛකාධිකාරී (වැබ.)
ගිංතොට ශ්‍රී ථූපාරාම රාජමහා විහාරාධිපති
විද්‍යානිධි පණ්ඩිත
**අම්බලන්ගොඩ
සුමේධානන්ද හිමි**

# ජීවිතයට පිළිවෙළක් තිබෙනවා නම් ඕනෑම අභියෝගයක් පහසුවෙන් ජය ගන්නට පුළුවන්



**අද අපි මුහුණ දී තිබෙන වසංගත රෝග තත්වය හමුවේ වැඩිහිටියන් ගේ පමණක් නොවෙයි, තරුණ තරුණියන් ගේ, පාසල් දරුවන් ගේ පවා අනාගත සැලසුම් යම් ආකාරයකට පසුබෑමකට ලක්ව තිබෙනවා.**

ඒ ත් රටක් ලෙස මේ තත්වයට අප සියල්ලෝ ම මුහුණදිය යුතු වෙනවා. ඒ, රටක අනාගතය රැඳි ඇත්තේ මේ දෙකොටස ම මත නිසයි. මෙහි දී අප ඇත්තට මුහුණදිය යුතු ම යි. එහි දී, ව්‍යසනයට ඔරොත්තු දෙන ආකාරයෙන් සිත ශක්තිමත් කර ගත යුතු යි. ඒ අනුව ක්‍රියාත්මක විය යුතු යි. අම්මා, තාත්තා, දූ දරුවන්ගෙන් පටන් ගෙන ඉහළ සිට පහළට සෑම සමාජ සමාජිකයෙක් ම ධෛර්ය සම්පන්න ව ඒ අභියෝගය වෙනුවෙන් වෙහෙසිය යුතු යි.

ඒ ජයග්‍රාහී මාවතේ දී

* සියලු දෙනා ම තමන් ගේ වගකීම තේරුම් ගැනීම

* තරුණ වියේ ඇත්ත ස්වභාවය තේරුම් ගෙන එයට වටිනාකම් ලබා දීම

* ආධ්‍යාත්මික දියුණුව සකසා ගැනීම

* ඉලක්ක ජය ගැනීමට දරුවන්ට මග පෙන්වීම

* තිසි සෞඛ්‍යයක් පවත්වා ගෙන යාමට පුළුල් ව සියල්ලෝ ම දායක වීම

* ජීවිතයේ වටිනාකම අවබෝධ කර දීම යන කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු වනවා.

සියලු දෙනා මේ ගැන අදහසක් ඇති කර ගන්නවා නම්, අභියෝග, අභියෝගයක් වන්නේ නෑ. එහෙත්

ඒ වෙනුවෙන් සියල්ලෝ ම කැපකිරීම් සිදු කිරීම අවශ්‍යය වනවා.

බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීම වෙනුවෙන් මොන තරම් කැපකිරීම් සිදු කළා ද? ප්‍රමාණය කළ නොහැකි තරම් වූ ඒ කැපකිරීම්වල ප්‍රතිඵලය නිසයි ලෝකයට මිල කළ නොහැකි අර්ථවත් දර්ශනයක් ලැබුණේ. උන්වහන්සේ ආදර්ශයෙන් පෙන්වා දුන්නේ අභියෝගවලට මුහුණ දෙන ආකාරය යි.

අද හෝ හෙට හෝ නොවෙයි. මෙවැනි අභියෝගාත්මක අවස්ථා ඉදිරියේ දී ත් ඇති විය හැකියි. බොහෝ දෙනෙක් පුරුදු වී සිටින්නේ තමන් මුහුණ දෙන කරදර, අභියෝගවල වගකීම අනුන් වෙත පැවරීමට යි. මේ රෝග උවදුරේ දී ත් එය පැහැදිලිව ම දකින්නට ලැබෙනවා. මෙහි දී වැඩි දෙනෙක් චෝදනා කරන්නේ රජයට යි. එහෙත්

සියල්ල රජය විසින් සිදු කරදිය යුතු ය යන මතයෙහි නොසිට තම තමන් ගේ වගකීම් සිදු කළ යුතු යි. සියල්ලෝ ම තමන් ගේ කාර්යය සිදු කිරීමට වෙහෙස මහන්සි වන්නේ නම්, අනුන්ගෙන් ඉල්ලා ගෙන කන තත්වයට පත් වන්නේ නෑ. ඉතා අපහසු අවස්ථාවක යම් විවේකයන් ලැබුවත්, තමන් හෝ, තමන් ගේ දරුවන් හෝ අන්ත දිළිඳු බවට පත් වන්නේ නෑ .

උපයා ගන්නා සුළු ප්‍රමාණයෙන් වුව ද කොටසක් ආපදා අවස්ථාවක දී ගැනීමට ඉතිරි කරන ලෙස අපේ බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්නේ මේ අවිනිශ්චිත බව නිසයි.

තමන් විසින් කළ යුතු දෙය නො කොට, අනෙකා ගේ කොටසෙහි අඩුලුහුඩුකම් බැලීම නොකළ යුතු දෙයක්. එහෙත් බොහෝ දෙනෙක් පුරුදු වී සිටින්නේ ත් එසේ කාලය ගෙවා දැමීමට යි. අපේ තරුණ දරුවන්ට හොඳ කායික ශක්තියක් තිබෙනවා. ඒ වගේ ම හොඳ මානසික ශක්තියක් තිබෙනවා. ඒ ජවය ත්‍රීරෝද රථයකට හෝ පහසු ආදායම් මාර්ගයකට යොමු කිරීම වැදගත් වන්නේ නෑ. මෙවන් කාලයක දී එහි ආදීනව බොහෝ තරුණයන් අත්විඳිනවා. බොහෝ දෙනෙක් රැල්ලට යනවා. ඒ කියන්නේ අනුකරණයට පෙළඹෙනවා. හොඳ අනුකරණය අගය කළ යුතු යි. එහෙත් බොහෝ දෙනෙක් තමන් ගේ හැකියාවන් හඳුනාගෙන ඇති බව පෙනෙන්නේ නෑ. සමහරු අනවශ්‍ය ලෙස කාලය කා දමනවා. ඉතින් වැඩ අතපසු වෙනවා. කාලය කා දැමීමට මඟක් සොයන්නේ ජීවිතවලට අරමුණු නැති වූ විටයි. හොඳ අරමුණක් නැති කමත් පිරිහීමට හේතුවක්.

> දරුවා අපේ බැවින් යම් නිශ්චිත කාල සටහනක් සකසා දී ඔහු මෙහෙයවීම මව්පියන් ගේ යුතුකමක්. එමෙන් ම දරුවන්ට ගුණධර්ම කියා දිය යුතුයි. අම්මට,තාත්තට කතා කරන හැටි, සහෝදර සහෝදරියන් සමඟ සමඟියෙන් ජීවත් වන හැටි, අනුන්ට කරදරයක් නොවී ජීවත් වන හැටි කියලා දෙන්නට කාගේවත් උපකාර අවශ්‍ය වන්නේ නෑ. අම්මා තාත්තට ඒ දේ කරන්න පුලුවන්.

බොහෝ ගැටලුවලට ප්‍රධාන ම හේතුව වන්නේ ආධ්‍යාත්මික සංවර්ධනය නැති බවයි. සරල ව පැහැදිලි කරනවා නම්, හොඳ සිතිවිලි නැතිකම යි. සමහර අයට ඉවසීම නෑ. සිහිය නෑ. ආගම, දහම ගැන අවබෝධයක් නෑ. තමන් කුමන දහමක් විශ්වාස කළ ද යම් පුංචි ම හෝ කාලයක් දෛනික ව ඒ වෙනුවෙන් යෙදවීම ඉතා වැදගත් බව බාල, මහලු හැම දෙනා ම තේරුම් ගන්නට ඕනෑ. අප තුළ යහපත් සිතිවිලි ගොඩනැගෙන්නේ එවිට යි. යම් ලෙඩක්, දුකක දී, කරදරයක දී සත්‍ය ක්‍රියාවක් මඟින් හෝ සහනයක් ලබා ගන්නට නම් ආධ්‍යාත්මික ශක්තියක් තිබිය යුතු යි. ධර්මපාල ජාතකයේ දී දිසාපාමොක් ආචාර්ය තුමා රජතුමාට පවසා සිටියේ හදිසියේ රජතුමා ගේ පුත් කුමරු මිය ගිය බවයි. එහෙත් රජු එය කිසිසේත් පිළි නො ගනියි. උපහාසයෙන් බැහැර කරයි. රජු කියන්නේ තමන් ගේ රටේ මිනිසුන් අඩු වයසින් නො මැරෙන බව යි. ඊට ප්‍රධාන හේතුව පස් පව් නොකිරීම යි. එවන් ආධ්‍යාත්මික පිරිසුදු බවක් අප තුළ ද වර්ධනය කර ගත හැකි වන්නේ නම්, එතරම් සුවයක් තව ඇත්තේ නෑ. එය අපහසු දෙයක් යැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන්. ඒ ත් පව අත් හැරීම අපහසු දෙයක් නොවේ. පව අත් හැරීමේ පහසු ම ක්‍රමය ජීවිතයේ ඇත්ත තේරුම් ගැනීම යි. ජීවිතය පිළිබඳ හොඳින් තේරුම් ගන්නට අවශ්‍ය කමටහන් ඕනෑ තරම් මේ දිනවල අප දකිනවා. අසනවා. ආධ්‍යාත්මික ශක්තිය ඇති කර ගත්තේ නම්, ඉදිරියේ දී හෝ මෙවන් තත්වයකට පහසුවෙන් මුහුණ දීමට මඟ හෙළි කර ගන්නට පුළුවන්.

රෝග උවදුර නිසා දරුවන් ගේ පාසල් අධ්‍යාපනය බිඳවැටී තිබෙනවා. බොහෝ මව්පියන් තමන් ගේ වගකීම් අමතක කොට අනුන්ට ම දෙස් කියනවා. අප මුහුණ දී සිටින්නේ සොබා දහම විසින් ලබා දුන් දරුණු දඬුවමකට යි. එවැනි පසුබිමක රෝගයට හෝ ගුරුවරුන්ට දෙස් කීම නිරර්ථකයි. ඒ වෙනුවට මව්පියන් ස්වයං වැඩපිළිවෙළකට යා යුතු වනවා. පන්තිභාර ගුරුවරු දුරකතනයෙන් සම්බන්ධ කොට ගෙන පෞද්ගලික මට්ටමින් මග පෙන්වීම ලබා ගත හැකියි. දරුවාට පෙළපොත් ලැබී තිබෙනවා. අවශ්‍ය ඔබේ කැපවීම සහ දරුවා ගේ උනන්දුව පමණයි. එය සියයට සියයක් ම සාර්ථක නොවුණ ද දරුවාගේ දැනුම මොට නොවී පවත්වා ගත හැකි වනවා. කිසිම ගුරුවරයකු එසේ උදව් කිරීමට අකමැති වන්නේ නෑ. ගුරුවරු දරුවන්ට ඒ යුතුකම් මනාව ඉටු කරනවා. ඒ අය ගේ වෘත්තීය අරගල හෝ අඩුපාඩු හෝ ඔබ ප්‍රශ්නයක් කර ගත යුතු නෑ. ඒ මන්දයත් සියල්න් ගේ ම ජීවිත, ජීවිත වන නිසයි.

දරුවා අපේ බැවින් යම් නිශ්චිත කාල සටහනක් සකසා දී ඔහු මෙහෙයවීම මව්පියන් ගේ යුතුකමක්. එමෙන් ම දරුවන්ට ගුණධර්ම කියා දිය යුතුයි. අම්මට,තාත්තට කතා කරන හැටි, සහෝදර සහෝදරියන් සමඟ සමඟියෙන් ජීවත් වන හැටි, අනුන්ට කරදරයක් නොවී ජීවත් වන හැටි කියලා දෙන්නට කාගේවත් උපකාර අවශ්‍ය වන්නේ නෑ. අම්මා තාත්තට ඒ දේ කරන්න පුලුවන්. හැබැයි ඔවුන් දෙදෙනා පළමුව නිසි මඟ ගමන් කරමින් දරුවන්ට හොඳ ආදර්ශයක් ලබා දෙන්නට ඕනෑ.

උදේ ම අවදිවීමට දරුවා හුරු කරවන්න. තමන් ගේ ආර්ථිකය, ජීවන බර දරුවන්ට අවබෝධ කර දෙන්න. අනාගතයේ දී ඇති විය හැකි ව්‍යසයන ගැන මේ වෛරස රෝග උවදුර ම උදාහරණ කොට ගනිමින් පැහැදිලි කොට දෙන්න. පොළොවෙහි පය ගසා ජීවත් වීමේ අගය කියා දෙන්න. ජීවිතයේ වටිනාකම දැනෙන්නට ඉඩ හරින්න. හොඳ පොතක් කියවන්ට පුරුදු කරන්න. දරුවන් ගැන හොඳ අවබෝධයෙන් ඉන්නා බව ඔවුන්ට දැනෙන්නට ඉඩ හරින්න. මේ පිළිවෙළ තුළ අනාගතයේ දී ඔවුන් ජීවිතයේ කවර අභියෝගයක් වුව ද පහසුවෙන් ජය ගන්නවා ඇති.

කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ
ධම්මින්ද හිමි**

# සම්බුද්ධ ශාසනය වගේ ම මව්බිම ආරක්ෂා කිරීමටත් කැප වුණා



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ අමරපුර සිරි සද්ධම්මවංශ නිකායේ අනුනායක ගෞරව ශාස්ත්‍රවේදී බෙන්ගමුවේ නාලක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.**

**දීර්ඝ කාලයක සිට ජාතික, ආගමික, ශාසනික, දේශපාලනික වශයෙන් ක්‍රියාශීලී ව කටයුතු කළ කීර්තිධර ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් ලෙස ප්‍රකට ව වැඩ සිටින ඔබ වහන්සේගේ පැවිදි ජීවිතයේ ආරම්භය පිළිබඳ ව සිහිපත් කරමින් ම සාකච්ඡාවට ප්‍රවේශයක් ලබා ගනිමු අපේ නායක හාමුදුරුවනේ**

මම කුඩා කාලයේ සිට ම අම්මාත්, අත්තම්මාත් සමඟ ගමේ පන්සලේ සිල් සමාදන් වුණා. සිල් සමාදන් වන අවස්ථාවල බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව මහා පුදුමාකාර ගෞරවයක්, භක්තියක්, ශ්‍රද්ධාවක් ඇති වුණා. එක්තරා දවසක සිහිනෙන් බුදුරජාණන් වහන්සේ ජීවමාන ව වැඩ සිටින ආකාරය දැකීමත් සමඟ බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව මගේ සිත තුළ තිබුණ ශ්‍රද්ධාවන්ත හැඟීම තවදුරටත් සිත තුළට තදින් කාවැදුණා.

මා, බෙන්ගමුව රජයේ විද්‍යාලයේ පාසල් අධ්‍යාපනය ලැබූ කාලයේ ගුවන් නියමුවෙක් වීමේ ආසාවෙන් අධ්‍යාපනය හැදෑරුවත්, කැටවල ධම්මාවාස ස්වාමීන් වහන්සේ ආචාර්යවරයකු වශයෙන් පාසලට වැඩම කිරීමත් සමඟ උන්වහන්සේගේ රූපයට, ගමන් විලාසයට, දේශනා විලාසයට මගේ සිත බොහෝ සේ ඇලුම් කළා. එම පැවිදි රුව නිසා මගේ සිත පැවිදිවීමට යොමු වුණා. ඒ අනුව 1962 වර්ෂයේ දී පැවිදිවීමේ අරමුණ ඇතිව කැලණිය ශ්‍රී පඤ්ඤාණන්ද ධර්මායතනයට පැමිණියා. විශේෂයෙන් හක්මන පඤ්ඤාණන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ යටතේ වසරක කාලයක් බණ දහම් ඉගෙන ගනිමින්, වතාවත් පුරුදු පුහුණු වෙමින් මූලික දැනුම ලබා ගත්තා. අනතුරුව මාතර කිරින්ද පුහුල්වැල්ල මණ්ඩලාරාම විහාරස්ථානයේ වැඩසිටි සාරානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් හක්මන පඤ්ඤාණන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ වගේ ම, මහාචාර්ය මාරඹ රතනසාර නායක හාමුදුරුවන් වහන්සේ ගේත් ආචාර්යත්වයෙන් 1963 වර්ෂයේ දී බෙන්ගමුවේ නාලක යන උත්තරීතර ශාසනික නාමයෙන් සම්බුද්ධ ශාසනයේ පැවිදි බවට පත්වුණා.

**ඔබ වහන්සේ ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගත් අවධිය සිහිපත් කරනවා නම් හාමුදුරුවනේ**

මගේ මෑණියන් වහන්සේගෙන් වගේ ම, මා පැවිදි කළ ආචාර්යපාදෝත්තමයාණන් වහන්සේලා දෙනමගෙන් පමණයි මම අධ්‍යාපනය ලැබුවේ. ලබා ගෙන තිබුණ එම මූලික දැනුම පාසලෙන් හෝ පිරිවෙනින් හෝ විශ්ව විද්‍යාලයෙන් ඔපවත් කර ගත්තා මිසක් ඒ තුළින් අලුතෙන් යමක් ඉගෙන ගත්තේ නැහැ. මම කුඩා කාලයේ දී මගේ මෑණියන් හැමදාම වගේ මම නිදා ගැනීමට යන විට මට කතන්දර කියල දෙනවා. ඒ බණ කතා තුළ මහා ධර්ම ශාස්ත්‍රීය ගැඹුරක් තිබුණ නිසා ඒ තුළින් විශාල දැනුම් සම්භාරයක් ලැබුණා. ඒ වගේ ම මම පැවිදි කළ ගුරු හාමුදුරුවන් වහන්සේ පාලි භාෂාව වගේ ම බණ දහම් ඉගැන්වුවා. එම මූලික දැනුම පසුකාලීන ව ඔපවත් කර ගැනීමට කටයුතු කළා. විද්‍යාලංකාර පිරිවෙන, මාතර මහා මන්තින්ද පිරිවෙන යන පරිවේණස්ථානයන් තුළින් පිරිවෙන් අධ්‍යාපනය ලැබුවා. කොළඹ මහජන පුස්තකාලයේ පොත්පත් පරිශීලනය කරමින් 1976 වර්ෂයේ දී උසස් පෙළ විභාගය සමත් වෙලා 1977 වර්ෂයේ දී කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණා. විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන අවධියේ පාලි භාෂා දැනුම තවදුරටත් ඔපවත් කර ගනිමින් ත්‍රිපිටකය, අටුවා, ටීකා කියවීමට පෙළඹුණ නිසා ධර්ම ශාස්ත්‍රීය දැනුම ඉතාම ඉහළින් ලබා ගත්තා. 1981 වර්ෂයේ දී ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය ලබා ගත්තා. ලොකු හාමුදුරුවන් ගේ අපේක්ෂාව ඉෂ්ට කරදීමේ බලාපොරොත්තුවෙන් ආචාර්ය උපාධිය ලබා ගැනීම සඳහා එංගලන්තයට වැඩම කළත්, උන්වහන්සේ ගේ අපවත්වීමත් සමඟ මට නැවත ලංකාවට වැඩම කිරීමට සිදු වුණා.

**ඔබ වහන්සේ එදා මෙදාතුර සමාජ සුභසාධනයෙහි ලා විශාල කාර්ය භාරයක් සිදු කරන බව අපට පෙනෙනවා. ඒ පිළිබඳ ව කෙටියෙන් යමක් ප්‍රකාශ කරනවා නම්, නායක හාමුදුරුවනේ**

යක්කඩුවේ පඤ්ඤාරාම නායක හාමුදුරුවන් වහන්සේ ගේ ආරාධනාව අනුව 1981 වර්ෂයේ දී විද්‍යාලංකාර පිරිවෙන් ආචාර්යවරයකු වශයෙන් සේවය ආරම්භ කරමින් වසර 27 ක් පුරා ම එම පිරිවෙනේ ම සේවය කළා. විද්‍යාලංකාර පිරිවෙනේ පිහිටුවා තිබුණ පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයට අයත් අනුබද්ධ ආයතනය තුළ වසර 4ක් ආචාර්යවරයකු ලෙස සේවය කළ කාලය තුළදීත් ජාතික සේවය අඛණ්ඩ ව කර ගෙන ගියා. එම කාලයේ දි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් සමඟ කටයුතු කිරීම ආරම්භ කළා. එතුමිය මට මවක් වගේ වුණා. ඒ වගේ ම එතුමිය ගේ ඇසුරත් සමඟ ජාතික දේශපාලනයට යොමු වුණා. එතුමිය ගේ ප්‍රධානත්වයෙන් මව්බිම සුරැකීමේ සංවිධානය පිහිටුවමින් මම එහි ලේකම් වශයෙන් කටයුතු කළා. අනතුරුව ඒ කාලය තුළ පළාත් සභා ගෙන ඒමට එරෙහිව ජාතික දේශපාලනය තුළින් විශාල මෙහෙවරක් ඉෂ්ට කිරිමට පුළුවන් වුණා.

ඒ වගේම දෙමළ ත්‍රස්තවාදීන් විසින් අපේ රට, ජාතිය ,ආගම, බෞද්ධ සිද්ධස්ථාන, භික්ෂූන් වහන්සේලා , සංස්කෘතිය,අසරණ ජනතාව විනාශ කළා. 1985 වර්ෂයේ සිට දෙමළ ත්‍රස්තවාදීන් සිදු කළ විනාශය වැළැක්වීමට පුරා වසර 24ක් ක්‍රියා කළා. මව්බිම ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අහසින්, මුහුදෙන්, කැලෑවල,මඩවගුරුවල, ගමන් කරමින් වීරෝධාර රණවිරුවන් දිරිමත් කරමින්, ගම්මාන ආරක්ෂා කිරීමට සහයෝගය ලබා දෙමින් වසර 24ක් මාතෘ භූමිය රැක ගැනීමට කටයුතු කළා. විදේශීය සංවිධානවල ආධාර උපකාරත් ලබා ගනිමින්, දේශප්‍රේමී භික්ෂු පෙරමුණ සංවිධානයත් පිහිටුවමින් ඒ හරහා මහා සංඝරත්නයත් සමඟ 1985 වර්ෂයේ සිට දෙමළ ත්‍රස්තවාදයෙන් පීඩාවට පත්වුණ උතුරු නැඟෙනහිර ගම්මාන විශාල ප්‍රමාණයකට උදව් උපකාර කළා. ඉඩකඩම් නිවාස නොමැති ව අසරණ පිරිස් වෙනුවෙන් හමුදාවේ සහාය ඇතිව පවුල් 3000ක් පදිංචි කරමින් ගම්මාන බිහි කළා . එම පිරිස් අපේ උරුමය රැක ගෙන තවදුරටත් සිටීම පිළිබඳ සතුටක් දැනෙනවා. ඒ වගේම දෙමළ ත්‍රස්තවාදී යුද්ධය අවසන් වනතුරු සෑම වසරක ම සිංහල අවුරුද්ද අපේ රණවිරුවන් සමඟ හමුදා කඳවුරක සිටියා මිස මම විහාරස්ථානයේ වැඩ සිටියේ නැහැ. සම්බුද්ධ ශාසනය වගේ ම අවුරුදු 24ක් පුරාම මව්බිම ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සිදුකළ ඒ මහා මෙහෙවර සිහිපත් කරන මොහොතක් පාසා සිතට මහා සතුටක් ඇතිවෙනවා. විරුවන් ඇසුරේ සූවිසි වසරක් යනුවෙන් ඒ යුදමය ඉතිහාසය පිළිබඳව මා විසින් රචනා කළ ග්‍රන්ථය , එවක ජනාධිපති, වර්තමාන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත පිළිගැන්වීමට කටයුතු කළා. ඒ වගේ ම මගේ ජීවිත කතාව හෙළ බොදු සව්වෙත්මි යනුවෙන් ග්‍රන්ථයකට රචනා කළා. මහා සිංහල ජාතික මතවාදය ආදී වශයෙන් ග්‍රන්ථ කතුවරයකු ලෙස පොත්පත් රාශියක් රචනා කර තිබෙනවා.

1986 වර්ෂයේ සිට සෑම වර්ෂයක දී ම සේරුවිල විහාරස්ථානය මූලික කරගෙන නිකිණි පින්කම හරහා

පන්සල නගා සිටුවීමටත්, ඒ හරහා මිනිසුන් ගේ ජීවිත නගා සිටුවීටමත් විශාල මෙහෙවරක් ඉටු කර තිබෙනවා.


**ජාතික, ආගමික, ශාසනික වශයෙන් ඇතිවන ගැටලු සම්බන්ධයෙන් ශාසන භාරධාරී නායක ස්වාමීන්වහන්සේලා වශයෙන් ගන්නා වූ පියවර කෙටියෙන් පැහැදිලි කරනවා නම්,**

ශාසනය ගැන කල්පනා කරන විට ඇතැම් කාරණා පිළිබඳ ව බොහොම කනගාටුදායකයි. ඉංග්‍රීසි ආණ්ඩු පැවැති කාලය තුළ ශාසනභාරධාරී භික්ෂූන් වහන්සේලා ගේ කාර්ය භාරය පහළට ඇදවැටුණා. උතුම් වූ ඒ කාර්යභාරය නැවත සම්පූර්ණ වශයෙන් යතා තත්ත්වයට පත්වෙලා නැහැ. ඉතිහාසය පුරාවට ම රට ජාතිය ආරක්ෂා කළ නිසා භික්ෂූන් වහන්සේලා ජාතියේ මුරදේවතාවුන් වහන්සේලා වශයෙන් හැඳින්වූවා. බොහෝ භික්ෂූන් වහන්සේලා ශාසනික කටයුතු මැනවින් ඉදිරියට කර ගෙන යමින් ශාසනය ආරක්ෂා කිරීමට මහත් උත්සාහයක් ගෙන යමින් සිටිනවා.

ඒ වගේම රට නගා සිටුවීම සඳහා දේශීයත්වය පදනම් කර ගත් ජාතික වැඩ පිළිවෙළක් මේ රටට අවශ්‍ය යි. දේශීය වෙදකමට අනුව පවතින කොරෝනා වසංගතයට ප්‍රතිකාර කළ හැකි යි. දේශීය වෙදකම නිවැරැදි ව ක්‍රියාත්මක කරමින් ප්‍රතිකාර කිරීම ආරම්භ කළා නම්, අපට ලෝකයේ විශාල ගෞරවයක් ලැබෙනවා. අතිගරු ජනාධිපතිතුමා දේශීය වෙදකමටත් නැඹුරුවක් දක්වමින් ක්‍රියාත්මක කර ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳ සතුටුයි.


හේමමාලා රන්දුනු

# මරු පරදා රහත් වූ
# මලියදේව මහ තෙරුන් වහන්සේ



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

**මලියදේව මහ රහතන් වහන්සේ හෙළදිව වැඩ සිටි අවසාන මහ රහතන් වහන්සේ බව ජනප්‍රවාදාගත පිළිගැනීම යි. උන්වහන්සේ ගේ අර්හත්භාවය සම්බන්ධයෙන් ගැමියන් අතර ඇති ප්‍රවාද සමූහයකි. මාරයා රවටා අර්හත්භාවය ලැබීමේ පුවත එයින් එකකි. “මරළුවාව” යන ග්‍රාම නාමය ලැබී ඇත්තේ ද එහි ප්‍රතිඵලයක් වශයෙනි.**



මේ තෙරණුවෝ රහත්බව ලබන අපේක්ෂාවෙන් බොහෝ කලක් මෙ ගම වැඩ සිටිමින් භාවනාවෙහි යෙදුණහ. තෙරුන් වහන්සේ දිනක් විහාර මලුව ඇමද භාවනාවට එළැඹියහ. එදින භාවනාවෙහි යෙදුණහොත් රහත්බව ලබා ගන්නා බව මාරයා දුටුවේ ය. එ බැවින් එය වැළැක්වීමට වෘෂභයකු ගේ වේශයෙන් විහාර මලුවට පැමිණියේ ය. මළ මූත්‍ර පහ කොට මලුව අපවිත්‍ර කොට යන්නට ගියේ ය. තෙරුන් වහන්සේ එය ඉවසමින් නැවතත් මලුව පිරිසුදු කොට භාවනාවට එළඹියහ. මෙය දුටු මාරයා තෙරුන් වහන්සේ ගේ සිත විකෘති නො වූ බව දැන වඳුරකු ගේ වේශයෙන් නැවත පැමිණ මලුවෙහි වූ ගස්වල අත්තෙන් අත්තට පනිමින් කොළ රොඩු බිම හෙළමින් සහ මළ මූත්‍ර කරමින් මලුව විරූප කොට කැළයට පැන ගියේ ය. මේ වතාවෙහි ද තෙරුන් වහන්සේ එය ඉවසමින් දෙවැනි වරටත් මලුව පිරිසුදු කොට භාවනාවට එළැඹියහ. එය දුටු මාරයා තෙරුන් වහන්සේ ගේ සිත තවමත් කෙලෙස්වලින් නො පිරුණු බව දැන කකුලක් අබල වූ කොරකු ගේ වේශයෙන් පැමිණ මලුව හැම තැන ඇවිද ඔහු ගේ කොර කකුලෙන් සහ සැරයටියෙන් ඉරි අඳිමින් නැවතත් භූමිය විරූප කළේ ය. එකල් හි තෙරුන් වහන්සේ “මෙ පමණ කලක් මාගේ භාවනාවට බාධා කළ එකදු කෙනකු නොමැත. අද මේ ස්වල්ප වේලාවෙහි තුන් දෙනකු ම පැමිණ මාගේ කටයුතු වැළකුවේ ය. ඒ තුන් දෙනා එක් අයකු ම විය යුතු ය. මේ මාරදිව්‍ය පුත්‍රයා ම විය යුතු ය. මෙ පමණ දවසක් මා මෙහි සිටිනු නුදුටු හෙතෙම අද පමණක් මා පෙනුණේ නිසැකයෙන් ම අද මා හට කෙලෙසුන් නසන්නට හැකි වන බව දැන ගෙන විය යුතු ය” යි සිතා චිත්ත සන්තුෂ්ටියට පැමිණියේ ය. කොරා අමතා “තා කවරෙක්ද?” යි ඇසී ය. එකල්හි මාර තෙමේ බොරු නො කියා සැබෑ තතු කියන්නේ “මම මාරදිව්‍ය පුත්‍රයා වෙමි” යි කී ය. එකල්හි තෙරුන් වහන්සේ මාරදිව්‍ය පුත්‍රයා බව දැන “ඔබ එසේ පැවසුවත් කෙසේ පිළිගත හැකි ද? මාරදිව්‍ය පුත්‍රයා වනාහි සිතූ සිතූ දේ මවා පෑ හැකි ඍද්ධිමතෙකි. මේ මොහොතෙහි සර්වඥයන් වහන්සේ ගේ රූපය මවා පෑවහොත් ඔබ මාරදිව්‍ය පුත්‍රයා බව පිළිගනිමි” යි වදාළහ. තෙරුන් වහන්සේ ගේ ඉල්ලීම ඉවතලිය නො හැකි වූ මාර දිව්‍ය පුත්‍රයා සිය සමර්ථකම් තෙරුන් වහන්සේ ඉදිරියෙහි දක්වන අදහසින් ඇසිල්ලකින් සර්වඥයන් වහන්සේ ගේ රූපය මවා දැක්වී ය. එයින් වන විපාකය හෙතෙම නො දුටුවේ ය. තෙරුන් වහන්සේ සවණක් රැස් විහිදෙන සර්වඥයන් වහන්සේ ගේ බුද්ධකාය දැක බුද්ධාරම්මන ප්‍රීති උපදවමින් සිත පහදවා ගෙන අර්හත්භාවය ලැබූහ.


> ඔබ එසේ පැවසුවත් කෙසේ පිළිගත හැකි ද? මාර දිව්‍ය පුත්‍රයා වනාහි සිතූ සිතූ දේ මවා පෑ හැකි ඍද්ධිමතෙකි. මේ මොහොතෙහි සර්වඥයන් වහන්සේ ගේ රූපය මවා පෑවහොත් ඔබ මාරදිව්‍ය පුත්‍රයා බව පිළිගනිමි”

මාරයා සිය සමර්ථකම් සිදු කොට බලන විට තෙරුන් වහන්සේ අර්හත් භාවයට පැමිණි බව දැක ලජ්ජාවෙන් පීඩිත වී ය. “තෙරුන් වහන්සේ මා වංචා කළේ ය” යි පවසමින් පලා යන්නට වූයේ ය. එ තැන් සිට එම ස්ථානය සහිත ග්‍රාමය “මාරයා රවටන ලද ස්ථානය” යන අර්ථයෙන් “මරහළුව” වූ බවත්, පසු කල එම නාමය “මරළුවාව” වූ බවත් ජනප්‍රවාදයක සඳහන් ය.

මෙම කතා පුවත විවිධ ස්වරූපවලින් ගැමි සමාජයෙහි ප්‍රචලිත වී පවතියි. ඇතැම් කතාවක දැක්වෙන්නේ වඳුරකු පමණක් මලුව අපවිත්‍ර කිරීම තෙවතාවක් ම සිදු කළ බව සහ වඳුරා ම බුද්ධ රූපය මවා පෑ බවකි. තවත් කතාවක දැක්වෙන්නේ තෙරුන් වහන්සේ සන්ධ්‍යා සමයෙක් හි මලුව හැමද පුද පූජා පවත්වා භාවනාවට එළැඹි කල්හි මාරයා කුරුමිණියකු ගේ වේශයෙන් පැමිණ තෙරුන් වහන්සේ ගේ හිස වටා මහත් වූ ශබ්ද නගමින් උන්වහන්සේ ගේ චිත්ත සමාධිය බිඳ දැමූ පුවතකි. තව ද මෙම කතා පුවතෙහි දෙවැනියට පැමිණියේ ගවයකු බවත්, හෙතෙම වර්චස් කිරීම් ශබ්දවලින් සහ ගවයා ගේ හඬතැලීම් ශබ්දවලින් තෙරුන් වහන්සේගේ චිත්ත සමාධිය බිඳ දැමූ බවත් සඳහන් ය. මෙහි තෙවැනි වාරයක තොරතුරු නොමැත. සෙසු කතාවල මෙන් අවසන් වන්නේ තෙරුන් වහන්සේ ගේ ඉල්ලීම පරිදි මාරයා බුද්ධ රූපය මැවීමෙන් සහ උන්වහන්සේ එම බුද්ධ රූපය දැක බුද්ධානුස්සති භාවනාවට එළඹ අර්හත් භාවය ලබා ගැනීමේ පුවතින් ය.

## කවරයේ කතාව

### අවුකන පිළිම වහන්සේ




අවුකන පිළිම වහන්සේ වැඩ සිටින්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි කලා වැවට බටහිරිනි. මෙම හිටි පිළිම වහන්සේ ක්‍රි.වර්ෂ පස්වන සියවසට අයත් ය. සීගිරිය නිර්මාණය කළ කාශ්‍යප රජු ගේ පිය රජතුමා ගේ රාජ්‍ය සමයේ ඉදිවූවකි. විශාල කළු ගල් පර්වතයක් හාරා පිළිම වහන්සේ ඉදිරියට ගෙන පර්වතයේ සෙසු කොටස් ඉවත් කර ඇත. ශරීරයේ පිට පෙදෙසේ කුඩා ප්‍රමාණයක් පර්වතයට සම්බන්ධ වන සේ ප්‍රතිමා වහන්සේ නෙළා තිබේ. සිරස්පත සමඟ ප්‍රතිමාවේ සම්පූර්ණ උස අඩි හතළිස් දෙකයි, අඟල් අටකි. සිරස්පත රහිත ව උස අඩි තිස් අටයි අඟල් දහයකි. පිළිම වහන්සේ ගේ පාද පිහිටුවා ඇත්තේ ශෛලමය පද්මාසනයක් මත ය. එය අඩි හතරයි අඟල් හතරකි. සිරසට වැටෙන දිය බිඳු නාසය දිගේ පැමිණ සිරිපතුල් අතරට වැටෙයි. දකුණු අතින් අභය මුද්‍රාව ද, වාම හස්තයෙන් කටක මුද්‍රාව ද නිරූපණය වෙයි. දෙතිස් මහා පුරුෂ ලක්ෂණවලින් පහළොවක් දක්වමින් කලා ශිල්පියා උත්සාහ ගෙන ඇත්තේ ජීවමාන බුද්ධකායක් ලෙස නිරූපණය කිරීමට ය. ලම්බක ව, සමබර ව සහ ඍජු ලෙස සංයමයකින් කළ නිර්මාණයකි. අවුකන නාමය ලැබීම සහ ප්‍රතිමාවේ නිමැවුම්කරුවා සම්බන්ධයෙන් අදටත් ඇත්තේ මතභේද සමූහයකි. දැඩි අව් රශ්මියේ, හුදකලාව ප්‍රතිමා වහන්සේ පිහිටි බැවින් අවුකන වූ බව එක් මතයකි. අවකන් දේශය සහ බාමියන් රට නමින් හඳුන්වන වර්තමාන ඇෆ්ගනිස්ථානයෙන් පැමිණි නිර්මාණකරුවකු විසින් කළ බව තවත් මතයකි. ගුරුවරයා සහ ගෝලයා අතර තරගයකින් ගෝලයා ගේ නිර්මාණයක් ලෙස බිහිවුණු බවට ද මතයක් පවතියි. ධාතුසේන රජතුමා ප්‍රතිභාපූර්ණ ශිල්පියකු ලවා කරවා ඇති අවුකන පිළිම වහන්සේ හෙළදිව මූර්තිකලාව පිළිබිඹු කරන්නෙකි. සමස්ත බෞද්ධ ජනතාව ගේ වන්දනා මානයට සහ බුහුමනට පාත්‍ර වන හෙළදිව විස්මිත කලා නිර්මාණයකි.



මල්වතු අස්ගිරි උභය විහාරයේ කාරක සංඝ සභික හිමිවරුන් 2009 වසරේදී...



සියවස් ගණනාවකට පසු අස්ගිරි මහා විහාරයේ දෙවන අනුනායක පදවිය යළි පිහිටුවීමේ අවස්ථාවෙන්...

# මල්වතු අස්ගිරි අනුනායක මාහිමිවරුන් ගේ වගකීම්

**සංඝ සම්මතය ද ඇතිව රජතුමා විසින් පත් කළ උභය මහා විහාරයීය අනුනායක පදවි ද මහානායක පදවියට පමණක් දෙවැනි වේ. මෙම පදවි සඳහා සුවිශේෂී වගකීම් සමුදායකි. මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නොමැති විට මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ මෙහෙවරට අයත් උපසම්පදා කටයුතුවල නායකත්වය ගැනීම අනුනාහිමිපාණන් වහන්සේට පැවරෙයි.**

උපසම්පදා පුණ්‍යකර්මවල උපසම්පදාපේක්ෂකයා ගේ දැනුම පරීක්ෂා කරනු පිණිස පාඩම් ඇසීම සිදු කරන්නේ අනුනාහිමිපාණන් වහන්සේ විසිනි. ජාතික උත්සව, විහාරස්ථානවල ආගමික කටයුතු ඇතුළු කටයුතු සිදු වන්නේ ද අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ගේ මූලිකත්වයෙනි.

මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක අපවත් වූ පසු දළදා කරඬුවේ රන් යතුර සුරක්ෂිත කිරීම, අපවත්වීම පිළිබඳ අනෙක් මහාවිහාරය සහ රජය වෙත දැනුම් දීම, ආදාහන කටයුතු සිදුකිරීම, අභිනව මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක පත් කිරීම ඇතුළු කටයුතු අනුනායක හිමියන් ගේ අනුශාසනා පරිදි සිදු කෙරෙයි.

මුල් වකවානුවේ අස්ගිරි මහා විහාරයේ ග්‍රන්ථ ධූරය වෙනුවෙන් අනුනායක ධුර දෙකක් සහ විදර්ශනා ධූරය වෙනුවෙන් එක් අනුනායක ධූරයක් වශයෙන් අනුනායක ධූර තුනක් පැවතුණ ද පසු කාලය වන විට එක් අනුනායක ධූරයක් පමණක් ඉතිරි වී පැවතුණි. වර්ෂ 1815 මාර්තු දෙවැනි දින මහනුවර මගුල් මඩුවේ දී මුළු ලංකාව ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම සංකේතවත් කරමින් උඩරට ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථමයෙන් බ්‍රිතාන්‍ය ධජය එසවූ අවස්ථාවේ එම ධජය පහත හෙළන ලද්දේ අස්ගිරි මහා විහාරයේ අනුනායක පදවිය හෙබවූ වාරියපොල සුමංගල අනු නාහිමිපාණන් වහන්සේ විසිනි.

දළදා වහන්සේ ගේ හිමිකරු රටේ රජු යන විශ්වාසය නිසා වර්ෂ 1818 නිදහස් සටන ආරම්භ වන අවස්ථාවේ දී නිදහස් සටන මෙහෙය වූ නායකයන්ට මහජන පක්ෂපාතීත්වය ලබා ගැනීම වෙනුවෙන් දළදා වහන්සේ හිමි කොට ගැනීමට අවශ්‍ය විය. දළදා මැදුරේ තේවා කටයුතු සිදු කළ වාරියපොල සුමංගල අනුනායක හිමියන් දළදා වහන්සේ රහසිගත ව පිටතට වැඩමවා මොණරවිල කැප්පෙටිපොල නිළමේතුමන් ප්‍රමුඛ නිදහස් සටනේ නායකයන් වෙත දළදා වහන්සේ භාර කොට මාතලේ වනගත ව සැඟවී සිටිමින්

## ලක්දිව සංඝරාජ පදවිය 4

සිවුරේ නුවාවෙහි දළදා වහන්සේ සඟවා ගෙන අප්‍රමාණ දුෂ්කරතා මධ්‍යයේ රැක ගනිමින් සිටිද්දී සුමංගල අනුනාහිමියන් ඉංග්‍රීසීන්ගේ අත්තඩංගුවට පත්ව යාපනය බන්ධනාගාරයේ සිරගත කරවන ලදි. මෙම අවස්ථාවේ දි අස්ගිරි විහාරයේ එක් අනුනායක පදවියක් පුරප්පාඩු වී යැයි සලකනු ලබන අතර, මෙයින් පසු කිසිදු හිමිනමක් එම අනුනායක පදවිය භාර ගැනීමට අපේක්ෂා නොකළ හෙයින් අනුනායක පදවිය අභාවයට ගොස් ඇත.

එමෙන්ම 1849 වසරේ උඩුමුල්ලේ රතනජෝති අනුනාහිමියන් මහානායක පදවියට පත් වූ අවස්ථාවේ පුරප්පාඩු වූ අනුනායක පදවිය වෙනුවෙන් ද කිසිදු හිමිනමක් පත් නොවූ බැවින් එම අනුනායක පදවිය ද අහෝසි වූ බව සඳහන් වෙයි.

මේ අනුව වර්ෂ 1850 පමණ කාලයේ සිට අස්ගිරි මහා විහාරයට පැවතියේ එක් අනුනායක පදවියක් පමණි. දිගු කලක් අස්ගිරි මහා විහාරයේ සිදු වූ සාකච්ඡාවන්හි ප්‍රතිඵල වශයෙන් වර්ෂ 2015 දී ගලගම ශ්‍රී අත්ථදස්සි මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහා නායක පදවියට පත් වූ අවස්ථාවේ දී රාජ්‍යපස්ථානීය පරමධම්මසභා නම් වූ අස්ගිරි මහා විහාරයේ විංශත් වර්ගික කාරක මහා සංඝ සභාවේ සමානච්ඡන්දයෙන් එම මහා නාහිමියන් එතෙක් හොබවන ලද අනුනායක පදවිය වෙනුවෙන් වරකාගොඩ ශ්‍රී ඤාණරතන නාහිමිපාණන් වහන්සේ ද, දිගු කලක් අහෝසි වී පැවති දෙවන අනුනායක පදවිය යළි පිහිටුවා ඒ වෙනුවෙන් වේඩරුවේ ශ්‍රී උපාලි නාහිමිපාණන් වහන්සේ ද පත් කොට වදාළ බැවින් වර්තමානයේ අස්ගිරි මහා විහාරයේ අනුනායක පදවි දෙකක් පවතී.

නායක පදවියක් දැරීමට තරම් ශක්තියක් නොමැති වූ අවස්ථාවන් හි දී එම පදවි ඉසිලූ ස්වාමීන්ද්‍රයන් වහන්සේලා පදවියෙන් ඉවත් වූ අවස්ථා හමුවෙයි. මල්වතු විහාරයේ ප්‍රථම මහානායක ව වැඩ සිටි තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත මහ නාහිමියන්ගෙන් පසු මහා නායක පදවියට පත් මැදවල ආනන්ද මහා නායක හිමියන් වයෝවෘද්ධභාවයට පත්ව සිටි බැවින්, සංඝරාජ හිමියන් ගේ අනුමැතිය ලබා පදවියෙන් ඉල්ලා අස් වූ බව සඳහන් වෙයි.

ශාසනික වශයෙන් කවර උත්තරීතර පදවියක් දැරුව ද මෙම තෙරවරුන් ද රාජ නීතියට යටත්ව ම විසූ බව හෙළිදරව් වන අවස්ථා ඇත. මල්වතු මහා විහාරයීය පෝයගෙට පැමිණෙන කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා එහි දී ඝාතනය කරවීමට සිදු කළ කුමන්ත්‍රණයක් සැලවීමෙන් සංඝරාජයන් වහන්සේ ලග්ගලට පිටුවහල් කළ බව ද, තිබ්බටුවාවේ බුද්ධරක්ෂිත හිමියන් වෙත ද දඬුවම් පැමිණ වූ බව සඳහන් වෙයි. ප්‍රසිද්ධියේ ම කිසිදු බියකින් තොරව රජු විවේචනය කළ නිසා මල්වතු විහාරයේ අනුනායක පදවිය දැරූ පරණතලේ අනුනාහිමියන්ගේ හිස ගසා අපවත් කරවූ බව සඳහන් වෙයි. ස්‍යාමෝපසම්පදාව පිහිටුවීමට පෙර ද වැලිවිට සරණංකර හිමියන් පැවිදි කරවූ සූරියගොඩ සිල්වතුන්ගේ හිස් ගසා දැමූ බවත්, අවස්ථා කිහිපයක දී නරේන්ද්‍රසිංහ රජු ගේ උදහසට වැලිවිට සරණංකර හිමියන් භාජනය වූ බවටත් තොරතුරු හමුවෙයි. සංඝරාජයන් වහන්සේට අකමැති වූ භික්ෂූන් වහන්සේලා දහම විකෘති කොට ජනතාව නොමඟ යැවූ බවත්, රජු විසින් විනිශ්චය කොට සීතාවක සහ මොරවක විසූ දෙතිසක් සංඝයා වහන්සේලා යාපනයට පිටුවහල් කළ බවත් සඳහන් වෙයි. ලන්දේසි ආණ්ඩුවෙන් ද තාන්න මාන්න ලැබීම නිසා සිංහල රජතුමා කරතොට ධර්මාරාම හිමියන් කෙරෙහි උදහස් වූ බවත්, කෙස් රැවුල් කැපීම පවා තහනම් කොට නිවාස අඩස්සියට පැමිණ වූ බවත් කියැවේ.

**මෙම ලිපියේ ඉතිරි කොටස බුදුසරණ බිනර පුර පසළොස්වක පෝද (සැප්: 20) පත්‍රයේ පළවේ.**

# ජීවිතය ලස්සන වන්නේ ඇත්ත තේරුම් ගන්නා තරමට යි

**කෙනෙක් තමන්ට ජීවිතය වැරදී ඇතැයි කියති. නැවත නිවැරැදි වන්නට නොහැකි යැයි ද කියති. වරැදි හදා ගන්නවා මිස මිනිස් ජීවිතයෙහි වටිනාකම දන්නා කිසිවෙක් එසේ කියන්නේ නැත. ඒ මිනිසෙක් ව ඉපදීම ම අතිශය කලාතුරකින් සිදු වන භාග්‍ය සම්පන්න අවස්ථාවක් වන බැවිනි.**

එපමණක් නොවේ, ජීවිතය පවත්වා ගැනීම ද දුර්ලභ ය. අපහසුවෙන් පවත්වා ගෙන ගිය ද බොහෝ දෙනකුට බුද්ධ ශාසනය මුණගැසීම ද දුර්ලභ ය. එහෙයින් ශ්‍රී සද්ධර්මය අසන්නට ලැබීම ද දුර්ලභ ය. එහෙත්, ඒ දුර්ලභ අවස්ථා සියල්ල ලැබීමට අපි වාසනාවන්ත වී සිටිමු. එපමණක් ද? නැත.

කුසල් මඟ යන්නට නොහැකි අවස්ථා අටෙන් ද අපි මිදී ඇත්තෙමු. ඒ අවස්ථා අට විස්තර වන්නේ මෙසේ ය.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව ඉපදී දහම් දෙසුව ද පුද්ගලයා නිරයෙහි උපත ලබා තිබීම.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව ඉපදී දහම් දෙසුව ද පුද්ගලයා තිරිසන් භවයෙහි උපත ලබා තිබීම.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව ඉපදී දහම් දෙසුව ද පුද්ගලයා ප්‍රේත විෂයෙහි උපත ලබා තිබීම.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව ඉපදී දහම් දෙසුව ද පුද්ගලයා දීර්ඝායු ඇති දේව නිකායක උපත ලබා තිබීම.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව ඉපදී දහම් දෙසුව ද පුද්ගලයා සිව්වනක් පිරිස් නැති ප්‍රත්‍යන්ත ජනපදයක උපත ලබා තිබීම.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව ඉපදී දහම් දෙසුව ද පුද්ගලයා මධ්‍යම ජනපදයන් හි දස වස්තුක මිථ්‍යා දෘෂ්ටික ව උපත ලබා තිබීම.

බුදුරජාණන් වහන්සේ මිනිස් ලොව ඉපදී දහම් දෙසුව ද පුද්ගලයා මධ්‍යම ජනපදයන් හි මෝඩ ව උපත ලබා තිබීම හා

අබුද්ධෝත්පාද කාලයක උපත ලැබීම ය.

අප විසින් ලබා ගත් මේ දුර්ලභ වූ අවස්ථාවෙන් උතුම් වූ ඵලයක් ලබා ගත යුතුම ය. අද සමාජයේ තෙරුවන් සරණ ගිය බහුතර පිරිසක් සිටිති. එහෙත් බොහෝ දෙනෙක් ප්‍රධාන වශයෙන් ම සිදු කරන්නේ බුදුරජාණන් වහන්සේට ආමිසයෙන් පුද පූජාවන් පැවැත්වීම ය. එය වරදක් නොවේ. වරද පවතින්නේ, ආමිස ප්‍රතිපත්තියෙන් ඈතට ගිය, පිළිවෙත් මාර්ගයට අවබෝධයකින් යුතුව යොමු නොවීම ය.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ "මල් සුවඳ ආදියෙන් මට පුද පූජා පවත්වන්නෝ මා පුදන්නෝ නොවෙති. ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්නෝ මා පුදන්නෝ වෙති". යනුවෙනි.

බුදුරජාණන් වහන්සේ ධර්මය ඔරුවකට උපමා කළහ. ඔරුවෙන් එතෙර වන්නා සේ එතෙරවීම පිණිස මිස ධර්මය කරගහගෙන යෑම පිණිස නොවේ යැයි දේශනා කොට වදාළහ.

ධර්ම මාර්ගයට යොමුවීමේ දී මල් පහන් පූජා කොට ශ්‍රද්ධාව දියුණු කර ගැනීම අවශ්‍යය ය. එම පූජාව ම පිළිවෙත් මාර්ගයට යොමු කර ගත හැකි ය. මල් පූජා කරන ගාථා රත්නයෙහි සරල අදහස නම් "මේ මල් පරව යන්නා සේ මගේ සිරුර ද විනාශ වී යන්නේ ය යන්නයි. මලක් සුවඳැති නම්, ප්‍රසන්න නම්, ඒ මල පිපෙන්නේ කොතනදැයි ගැටලුවක් ඇති කර ගත යුතු නැත. මඩ වගුරුවල හටගන්නා වූ ඕලු, නෙළුම්, මානෙල් මෙන් ම කටු අතුවල පිපෙන්නා වූ රෝස මලටත් හිමි වන්නේ ඉහළ ම තැනකි. මේ කොයි තැන පිපුණ මලක් වුව ද නොළා ගෙනැවිත් බුදු පුද පවත්වයි. එහෙත් මේ මල් පරව යයි. බුදු පුදට පෙර පිපුණු තැන නොසලකා, මල් නෙළා ගෙන පැමිණ ඉහළම තැනක තබා ගෞරව කරයි. අපේ මේ සිරුර ද ලෙඩ දුක් සමග මදිරාගෙන යන්නේ ය. මල් පර වෙන්නට පෙර නෙළා ගෙන පැමිණ බුදු පුදට ගන්නා සේ, මේ ජීවිතය දදිරා ගෙන ගොස් මරණයට පෙර යහපත් ප්‍රයෝජනයක් ගත යුතු වේ. ඒ ප්‍රයෝජනය ගැනීම නම් ඇස, කන ආදී වූ ඉන්ද්‍රියයන් සතුටු කිරීම හෝ පිනවීම ම පමණක් ම නොවේ. කායික හා වාචසික සංවරය නම් වූ ශීලයෙහි පිහිටා හැකිතාක් දුරට ධර්මානුකූල ව ම ජීවිතය පැවැත්වීම ය.

ඉගෙනීම, වෘත්තිය, විවාහය, ගේ දෙර, ඇඳුම පැළඳුම මෙන් ම සමාජයේ යුතුකම් ආදී මේකවර දේ තුළ ද ධර්මානුකූල බවක් තිබිය යුතු ය. ධර්මානුකූල මඟක් තුළ වුව ද මේ සියල්ල ම ප්‍රිය වශයෙන් ඉහළ ම ආකාරයකින් කළ හැකි ය. මෙයට හොඳම උදාහරණය වන්නේ විශාකා මහා උපාසිකාව සහ අනේපිඬු සිටාණන් ය.පියකරුව ද, ධනවත් ව ද, සතුටින් ද මේ අය ජීවිත් වූ හ. මාර්ගඵල ලාභීහු ද වූ හ.

සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ, මංගල ආදී සූත්‍රයන් හි සඳහන් අයුරින් අප ගේ ලෞකික ජීවිත පැවැත් ම සුපසන් කර ගත හැකි ය. ඒ වගේ ම වසල, පරාභව සූත්‍ර දේශනාවන් හි සඳහන් අයුරින් පරිහානියට නොයා හැකි ය. මහා සතිපට්ඨාන සූත්‍රයට අනුව සිහිය පැවැත්වීම දියුණු කළ හැකි ය. ආනාපාන සතිය මෙන් ම කායගතාසති සූත්‍ර ඇසුරු කළ හැකි ය. කොපමණ කාර්යය බහුල වූ ව ද "මේ මොහොතේ ජීවත්වීම" පුරුදු කළ හැකි ය. පස්පව් දස අකුසල්වලින් බැහැර විය හැකි ය. දරුවන්, මව්පිය, ස්වාමි – භාර්යාවන් "මම – මගේ යැයි කියනු ඇත. යම් අවස්ථාවක මව්පිය දරුවන් එකිනෙකාට සමීප ව නුඹලා මගේ යැයි පවසයි. ඒ වගේ ම මගේ ඇස් දෙක වගේ යැයි කියයි. ස්වාමි – භාර්යාවන් "නුඹ වැනි අයෙක් මට මුණ ගැසුණේ, මගේ පෙර පිනකට" යැයි පවසනු ඇත. ඔවුන් එකිනෙකා කෙරේ ප්‍රිය දෑසින් බලමින්, ප්‍රිය වචන කතා කරමින් 'කිරි හා පැණි' මෙන් ශරීර දෙකක් වුවත් එකම ජීවිතයක් මෙන් පැවැත්වීමට කැමති යි. ඔබට නකුල පිතු සූත්‍රය කියවා බැලිය හැකියි. එසේ සම්මතයෙහි පිහිටා මෙලොව සැනසිලිමත් ජීවිතයක් ගත කළ හැකියි.

එනමුත් මේ සියල්ල ම සකස් විය යුත්තේ පරමාර්ථ ධර්ම අවබෝධය හා සමඟින් බව සිතන්න.

සම්මුතියට අනුව මව්පිය, දරුවන්, ස්වාමි – භාර්යාවන් "නුඹ මගේ, සැමදාම මේ වගේ සිටිනවා" යැයි පැවසුව ද විදසුන් නුවණ එය නොවේ. පරමාර්ථ හෙවත් විපස්සනාවට අනුව "මමවත් මට හිමි නැති ලොවක් තුළ ඔබ කොහොම ද මගේ වෙන්නේ. මටවත් මා ගැන කිසි ලෙස යමක් පැවසිය නොහැකි මේ අනිත්‍ය වූ ලෝකයේ, නුඹ සමඟ හැමදා ම එක්ව සිටිනවා යැයි පැවසිය හැක්කේ කෙසේ ද?


මෙලොව පණ ඇති, පණ නැති සියල්ල ම සංස්කාර නම් වෙයි. මේ සියලු වස්තූන් අනිච්ච, දුක්ඛ, අනත්ත නම් වූ ත්‍රිලක්ෂණ ධර්මයට යටත් වෙති. මේ නොයෙක් අපවිත්‍ර දෙයින් පිරුණු ශරීරයේ හිස් මුදුනේ සිට පාදාන්තය දක්වා ම ගළපා බලන්න. අපට කිසිදු සැබෑ අයිතියක් වේ ද? නුවණින් ගළපා බලන විට දිරා නොයන, අත් නොහැරෙන, අපට ඕනෑ ආකාරයට පවත්නා යමක් පවතී දැයි විදර්ශනා නුවණින් විමසා බලන්න. සරල ලෙසින් සිතා බලන්න, හිසේ ඇති කෙස් ගසක, ඇස් පිහාටුවක, රෝම කූපයක තරම්වත් සැබෑ අයිතියක් මගේ යැයි පවසන මේ ශරීරයෙහි නැහැ නේද?.

ඔබ දිනකට කොපමණ වාරයක් කවා, පොවා, නාවා, සරසා, කැඩපත, සමීපයේ මේ ශරීරයේ හැඩ බලන්නේ ද? පඨවි, ආපෝ, තේජෝ, වායෝ නම් වූ සතර මහා භූතයන් ගේ නිර්මාණය වූ මේ ශරීරය පඨවි ආදී ධාතු කොටස් විසිරී යෑමෙන් ලෙඩ වෙයි. දිරා ගෙන යයි. ඇස්, කන් ආදී ඉන්ද්‍රියන් දුබල වෙයි. මුළු ශරීරය ම දුබල වෙයි. හේතූන් නිසා හටගත් ඵලය හේතූන් නැතිව යන විට නැතිව යයි. යමක් හටගන්නා සුළු ද ඒ හැම නැසෙන සුළු ය.

සම්මුතියෙහි අපගේ ජීවිත නිවැරැදි ව සහ සතුටින් ගත කළ හැකි අතර පරමාර්ථ ධර්ම අවබෝධයෙන් 'අත්හැරීම ද' පුරුදු කළ හැකි ය. ඒ වගේ ම සම්මුතියෙහි පවත්වන, කම්කටොළුවලින් පිරි සාමාන්‍ය අශ්‍රැතවත්, පෘථග්ජන ජීවිතවල බොහෝ දුක් දෙම්නස්වලට හේතුව මිල මුදල් හිඟ පාඩුව ම නොවේ. එය ද එක් හේතුවක් විය හැකියි. නමුත් බොහෝ කෙනෙක් දුක් විඳින්නේ අභාවිත සිත් නිසා ය. එනම් පරමාර්ථ ධර්මය තරමකින් හෝ පුරුදු නො කිරීමෙන් මේ සංස්කාර ලෝකයේ ඇඩි ආශාවන් හා පටිඝය හෙවත් ගැටීම් ඇති කර ගැනීම නිසා ය.

සම්මුතිය සහ පරමාර්ථය හඳුනා ගන්නා විට මේ ජීවිත පැවැත්ම සන්සුන් වෙයි. මේ වෙනස් වන ලෝකය තුළ කිසිවක තදින් ඇලෙන්නේ ද, ගැටෙන්නේ ද නැත. බුදුරජාණන් වහන්සේට කරන වන්දනාව බුදුරජාණන් වහන්සේ දහම් ඇසෙන් දැකීමක් බවට පත්වෙයි.

> ‘මලක් සුවඳැති නම්, ප්‍රසන්න නම්, ඒ මල පිපෙන්නේ කොතනදැයි ගැටලුවක් ඇති කර ගත යුතු නැත. මඬ වගුරුවල හටගන්නා වූ ඕලු, නෙළුම්, මානෙල් මෙන් ම කටු අතුවල පිපෙන්නා වූ රෝස මලටත් හිමි වන්නේ ඉහළ ම තැනකි. මේ කොයි තැන පිපුණ මලක් වුව ද නොළා ගෙනැවිත් බුදු පුද පවත්වයි.’



දීපා පෙරේරා

# ගම්මැදගම ඤාණිස්සර නාහිමි



**සියම් මහ නිකායේ මල්වතු පාර්ශවයේ ,මාතර මහ දිසාවේ අධිකරණ සංඝ නායක , රොටුඹ පෙත්මඟ පුරාණ රාජ මහා විහාරය, දෙන්කන්දළිය බෝධිරාජාරාමය. තල්ගස්තැන්න මගධ විහාරය යන විහාරත්‍රයාධිපති, විශ්‍රාමික විදුහල්පති, ශාස්ත්‍රපති ,සද්ධර්ම කීර්ති ශ්‍රී පඤ්ඤසාරාභිධාන , ගම්මැදගම ඤාණිස්සර නාහිමිපාණෝ පසුගිය 31 න දින අලුයම් කාලයේ දී මාතර මහ රෝහලේ දී අපවත් වූ සේක.**

අපවත්වන විට 68 වන වයස් පිරිපුන් උන්වහන්සේ කලක් රෝගාතුර ව ප්‍රතිකාර ලබමින් සිටියහ.

මාතර දෙයියන්දර ගම්මැදගම ග්‍රාමයේ වැදගත් කුල පරම්පරාවකට හිමිකම් කියමින්,හේනෙගෙදර විසූ මුණසිංගේ සර්දියස් මහතා ගේ සහ මුණසිංහ ආරච්චිගේ කවතිහාමි මාතාව ගේ සිව්වන දරුවා ලෙස,1953 වසරේ මාර්තු මස 15 වැනිදින ජනිත වූ මෙම පින්වත් කුලකුමරුවා, මුණසිංහගේ කුලරත්න නම් විය. සහෝදරියන් දෙදෙනකු ගේ ත්, සහෝදරයන් හය දෙනකු ගේ ත් සෙනෙහස ලබමින් ළමා කාලය ගෙවමින්, ගම්මැදගම කණිෂ්ඨ විද්‍යාලයෙන් මූලික සිප් සතර හැදෑරිය. ආගම දහම ගැන ඇති වූ නොතිත් ආසාව නිසා , රොටුඹ පෙත්මග පුරාණ රාජ මහා විහාරයේ විහාරාධිපති, රොටුඹ පඤ්ඤසාර හිමිපාණන් ගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙන්, 1968 වසරේ පෙබරවාරි මස 15 වැනි දින ප්‍රව්‍රජා භූමියට ඇතුළත් වූ හ.




දහම් අධ්‍යාපනය සදහා ඌරුබොක්ක ශ්‍රී මේධංකර පිරිවෙනෙහි ආරම්භක පළමු ශිෂ්‍යයා ලෙස ඇතුළත් ව, ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ උන්වහන්සේ පසුව සපුගොඩ විද්‍යාණිකේත පිරිවෙනෙන් පිරිවෙන් අධ්‍යාපනය නිමා කරන ලදී. 1974 වසරේ ජූනි මස 8 වැනිදින මහනුවර සියම් මහ නිකායේ මල්වතු පාර්ශවයේ මංගල උපෝෂ තාගාරයේදී,රොටුඹ පඤ්ඤසාර හිමියන් ගේ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක් ලෙස අධිශිල සංඛ්‍යාත උපසම්පදා ශිලයට පත් වූ හ.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත්, කැලණි විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය සහ අධ්‍යාපන ඩිප්ලෝමාවත් ලැබූ උන්වහන්සේ ජාතික අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනය පිළිබද පශ්චාත් ඩිප්ලෝමාවක් ද ලබා ගත්හ.

කොළඹ රාජගිරිය නාවල ආනන්ද විද්‍යාලයේ ආචාර්ය වරයකු ලෙස රජයේ ගුරු සේවයට එක්ව ඉන්පසු ව , මාතර නාරන්දෙණිය මහා විද්‍යාලයේ උප විදුහල්පති ලෙසත්, විදුහල්පති ලෙසත් සේවය කර ඉසිඹු ලැබූහ.

1991 වසරේදී රොටුඹ පෙත්මග පුරාණ රාජ මහා විහාරාධිපති හිමියන් ගේ අපවත් වීමෙන් පසුව, විහාරාධිපති ධූරයට පත් වූ උන්වහන්සේ, රොටුඹ හා තදාසන්න ගම්වරයන්ට දහම් ප්‍රඥව ලබා දෙමින් සාසනික මෙහෙවර ඉටු කරමින් සිටියදී 2014 වර්ෂයේ මාර්තු මස ,මල්වතු පාර්ශවයේ ගරුතර මහා කාරක සංඝ සභාව විසින් මාතර මහ දිසාවේ අධිකරණ සංඝනායක ධූරය උන්වහන්සේට පිරිනමමින් අක්තපත්‍ර ප්‍රදානය කර තිබේ.

ශ්‍රී දන්තධාතූන් වහන්සේට පවත්වන උපහාර පූජාවක් ලෙස, රොටුඹ පෙත්මග පුරාණ රාජ මහා විහාරස්ථානය මගින් ශ්‍රී දළදා සමිඳුන්ට පූජෝපහාර සඳහා වූ ඇසළ මහා දළදා පෙරහර වර්ෂ 16 පුරා පවත්වා ගෙන ඒමට උන්වහන්සේ පියවර ගැනීම පළාත් වාසීන් ගේ නොමද අගැයීමට බඳුන්විය.

කලකට පෙර රෝගාතුර වූ උන්වහන්සේ වෛද්‍ය ප්‍රතිකාර ලබමින් සිටියදී අපවත් වී වදාළහ.

සම්බුදු සසුන ඒකාලෝක කරමින් ආගමික, සංස්කෘතික සහ සංවර්ධනාත්මක වූ යුග මෙහෙවරක් කළ සංඝ පීතෘවරයකු වූ මාතර මහ දිසාවේ අධිකරණ සංඝ නායක, පඤ්ඤසාරාභිධාන පූජ්‍ය ගම්මැදගම ඤාණිස්සර මහ නාහිමිපාණන් වහන්සේට අජරාමර අමාමහ නිවන් සුව පතමු.!

**පියසේන මද්දුමගේ**
**මාවරල සමූහ**

02 පිටුවෙන්....

## ආහාරය බෙහෙතක් ලෙස නොගත්තොත්...

අද බොහෝ ජන මාධ්‍ය ඇතුළු විවිධ ක්‍රමවේද මගින් ආහාර සම්බන්ධයෙන් කෙරෙන ප්‍රචාරණය අතිශය හානිදායකයි. ඒ බව විශේෂඥ මතය ද වී තිබෙනවා. ශරීරයට අහිතකර බොහෝ දේ, සරල ව කියනවා නම් වස විස සහිත ආහාර විකුණන්නට උත්සාහ කරන්නේ හිරිකිතයකින් තොරවයි. එවන් පරිසරයක අප වඩ වඩාත් විචක්ෂණශීලී විය යුතුව තිබෙනවා.

අප ගේ මුවට ගන්නා දේ නියම ආහාරයක් බවට පත් වන්නේ එමගින් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥ යන ගුණාංග පහ අප තුළ ඇති කරන්නේ නම් පමණක් බවයි බෞද්ධ ඉගැන්වීම වන්නේ.

### තෝරාගැනීම පරිස්සමෙන්

මේ අනුව සසඳ බලා ආහාර තෝරා බේරා ගැනීම ප්‍රවේශමෙන් කළ යුතු වනවා. හොඳින්, බුද්ධිමත් ව සිතා බලන්නේ නම්, පෙනී යන්නේ වෙළෙඳ දැන්වීම් මගින් විශාල පෙළඹවීමක් ඇති කරන, වෙළෙඳසල් හි සිත් ඇද ගන්නා ලෙස අසුරා තිබෙන, රස ගුණ පිරි ආහාර ලෙස පෙන්වා දෙන ආහාරවලින් වැඩි හරිය අදාළ කරුණට හාත්පසින් ම විරුද්ධ වූ වස විස ම වන බව යි.

අද රසකාරක, සුවඳ කාරක, වර්ණ කාරක ලෙස ආහාර ප්‍රියජනක කර ගැනීම සඳහා යොදා ගැනෙන බොහෝ කෘතිම ද්‍රව්‍ය හෙවත් රසායනික සංයෝග වෙන කිසිවක් නොවෙයි. පිළිකා ඇතුලු භයානක රෝග කාරක වන වස විස ම වන බව මෙහිදී අප දැනුම්වත්විය යුතුයි.

එක් අවස්ථාවක අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤසීහ මහ නාහිමියන් පෙන්වා දුන්නේ, ශ්‍රී ලාංකික ජනතාව විනාශ කරන සුදු දේවල් පහක් ඇති බව යි. ඒ අන් කිසිවක් නොව සුදු හාල්, සුදු සීනි, සුදු පාන්, සුදු පිටි, සුදු සංස්කෘතිය යන කරුණු ය. මෙහි සුදු පිටි යන්නට ඇතැම් කිරිපිටි ද අඩංගු වන බව සැලකිය යුතු යි.

රටක් රැකෙන්නට නම් මිනිසුන් රැකී සිටිය යුතුයි. රටක් සංවර්ධනය වන්නේ, ඒ රටේ ජනතාව නිදුක් නිරෝගී ව සිටිනා තරමට යි . විශේෂයෙන් ම අපේ අනාගත පරපුර පිළිබඳ ව සලකන විට මේ කාරණය වඩාත් සංවේදීයි. ඒ, ළමා හා තරුණ පිරිසේ යහ පැවැත්ම මත සියල්ල තීරණය වන නිසයි. මෙහි දී දැනට පෙනෙන්නට ඇති පරිසරය නම් අතිශයින් ම කනගාටුදායක බව කනගාටුවෙන් වුව ද පිළිගන්නට වෙනවා. මෙහිදී අප තීරණාත්මක තීරණයකට පැමිණිය යුතුයි. ඒ දිවට මුල් තැන දෙනවා ද? ඇසට මුල් තැන දෙනවා ද? නාසයට මුල් තැන දෙනවා ද? විලාසිතාවට මුල් තැන දෙනවා ද? එසේ නොමැති නම් බුද්ධියට ම තැන දී, සිහි කල්පනාව පෙරදැරි කර ගෙන එදිනෙදා ආහාරය තෝරා බේරා ගන්නවා ද යන්නයි.

### සිහිනයෙන් නොව සිහිබුද්ධියෙන් තීරණ ගන්න

බොහෝ දෙනෙක් තමන් නොදැනුවත්ව ම හෝ මුදලට ම මුල් තැන දෙන ඇතැම් ආත්මාර්ථකාමී ව්‍යාපාරික සමාගම්වල වහලුන් බවට පත් ව සිටින බව නම් පිළිගන්නට ම වෙනවා. දැන් හෝ අපි මේ නින්දෙන් අවදි විය යුතුයි. සිහිනයෙන් තීරණ ගන්නවා වෙනුවට සිහි බුද්ධියෙන් තීරණ ගත යුතුයි. තමන්ගේ ආහාරය පිළිබඳ සිතන විදිහ වෙනස් කර නො ගත්තේ නම්, අප හැමගේ ම විනාශය නුදුරේ ම අත්වන බව මේ දැන් දැන් දකින නිදර්ශන මගින් ම අවබෝධ කරගත යුතු ව තිබෙනවා.

මේ කාලයේ අප අත්විඳින කොරෝනා වසංගතයට ද මුහුණ පෑ හැකි සාර්ථක ම ක්‍රමවේදය එය යි. ඒ කියන්නේ නිවැරැදි ආහාර රටාව මගින් අප, අප තුළ ම ප්‍රතිශක්තිකරණය නිපදවා ගන්නට උත්සාහ කළ යුතුයි. අපි අපේ අභ්‍යන්තර ශක්තිය ජනනය කර ගැනීම මගින් අපේ ආරක්ෂාව ඒකාන්තයෙන් ම සලසා ගත හැකිය යන්න අවබෝධ කර ගත යුතු යි. අප ජීවත් වන්නේ භයානක වූ ත්, අනාරක්ෂිත වූ ත් තත්වයකයි. ඉන් මිදිය හැකි වන්නේ නිවැරැදි හා ධර්මානුකූල පැවැත්ම මගින් ම බව අවබෝධ කර ගත යුතුයි. එය අදට පමණක් නොවෙයි. අනාගතයටත් එලෙස ම යි.

“ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී” යන අප කවුරුත් දන්නා ධර්ම පාඨය නිතර සිහි කිරීම හා අනුගමනය කිරීම කාගේත් යහපත පිණිස පවතින බව සිහිපත් කරමින් ඒ අනුව අපගේ හැසිරීම් හසුරුවා ගත යුතුයි. එවිට අනාගතයේ බත් පිඟානට වඩා ලොකු බෙහෙත් පිඟානක සරණ ලබමින් අසරණ වීමට සිදු නොවනු ඇති.

# සුවපත් මනසක් සැපවත් දිවියක්



ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශක
ආචාර්ය **සුරංග අමරකෝන්**

මුළු මහත් ලෝකය ම කොරෝනා වසංගතය හේතුවෙන් මහත් ව්‍යසනයකට මුහුණ දෙමින් සිටී. මෙතෙක් ගත කළ අති ධාවනකාරී ජීවන රටාව වෙනුවට සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් ජීවිතය පවත්වා ගෙන යාමට සිදුව තිබේ. තවදුරටත් යහපත් සෞඛ්‍ය තත්වයක් පවත්වා ගනිමින් වෛරසය සමග ජීවත්වීමට සිදුවනු ඇත. මෙහි දී යහපත් සෞඛ්‍ය තත්වයක් පවත්වා ගැනීම යනු, ලෙඩ රෝගවලින් ආරක්ෂාවීම පමණක් නොවේ. කායික සෞඛ්‍යය පිළිබඳ මෙන් ම, මානසික හා සාමාජීය සෞඛ්‍යය පිළිබඳ ව ද සැලකිලිමත්විය යුතු ය. එවැනි යහපත්දිවි පැවැත්මකට අවැසි මාර්ගෝපදේශයන්ගෙන් සුපෝෂිත බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ ව අප ගේ අවධානය යොමු කිරීම කාලෝචිත ය.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් දේශිත ශ්‍රී සද්ධර්මය, මිනිසා ගේ සසර ගමන නවතා සදා සැනසුම, නිවන ලබා දීම පිණිසම හේතු වේ. බොදුනුවන් ගේ එකම බලාපොරොත්තුව ද එය ම ය. එසේ වුව ද බුදු දහම මෙලොව දිවියෙන් පලායාමක් නොවේ. සියල්ල අසුභ ලෙස දකින, මෙලොව බැහැරකොට පරලොව සඳහා ම පමණක් වූ දහමක් ද නොවේ. දුක ගැන පමණක් නොව සැප ගැන ද කතා කරන දහමකි. මෙලොව දියුණුව හා පරලොව දියුණුව සැලසෙන, සමාජයේ සැමට ම සුවසෙන ළඟා කර ගත හැකි උසස් ජීවන මඟකි. මිනිස් දිවිය අදියරෙන් අදියරට දියුණු කර එහි උසස් ම මිනිසා ලොවට දායාද කළ හැකි සනාතන උතුම් දහමකි.

පුද්ගලයා ගේ දියුණුව සමාජයේ දියුණුව යි. එමෙන් ම පුද්ගලයා ගේ පිරිහීම සමාජයේ ද පිරිහීම යි. මේ බව දැක්වෙන දේශනා රාශියකි. එයින් කියැවෙන්නේ නිවන කරා යන ගමන් මඟට වඩා පුද්ගලයා ගේ මෙලොව ජීවිතය යහපත් කර ගැනීමේ මඟයි. ඒ මං ඔස්සේ ගමන් කරන සිල්වත්, නැණවත් පුද්ගලයා තුළින් යුක්ති ගරුක දියුණු සමාජයක් ගොඩ නැගේ.

පරිසරය මිනිසා ගේ ගතිගුණ, හැඩ රුව, සිතුම් පැතුම් වෙනස් කරයි. එහි දී පුද්ගල හා සමාජ ඇසුර වැදගත් වේ. නුසුදුසු අයහපත් ඇසුර නිසා මිනිසා පමණක් නොව තිරිසන් සතුන් පවා වෙනස් වන අයුරු නොයෙක් කතාවලින් අපි දනිමු.

මේ නිසා බුදුන් වහන්සේ ඇසුරු කළයුතු හා නොකළ යුතු අය ගැන මෙසේ හඳුන්වා ඇත.

තමාට වඩා ගුණ ණුවනින් පහත් අය ඇසුරු කිරීමෙන් පිරිහේ.

තමා හා සමාන අයකු ඇසුරු කිරීමෙන් පිරිහීමට පත් නොවේ.

තමාට වඩා උතුම් අයකු ඇසුරු කිරීමෙන් තම දියුණුව උදාවේ.

මෙයින් පෙන්වන්නේ සමාජයේ ජීවත්වන පුද්ගලයාට නොයෙක් අය ඇසුරට ලැබුණත්, ඉන් ගුණයෙන් බුද්ධියෙන් උසස් අය ඇසුරු කර තම එදිනෙදා දිවියේ ගැටලු විසඳ ගත යුතු බවයි. ඒ සඳහා බුද්ධිය හා ධර්මය උපකාර කර ගත යුතු බවයි.

කායික හා මානසික සුවතාවයට බාධා නොවී ආහාර පාන සපයා ගැනීමට හැකිවීම හා ගුණ නුවණ දියුණු කර ගැනීමට හැකිවීම යන කරුණු තමා ජීවත්වන පරිසරයක් තුළින් සලසා ගැනීමට හැකියාව තිබිය යුතු ය. මෙසේ පරිසරය යහපත් කර ගැනීමෙන් උසස් ජීවිතයක් ළඟා කර ගැනීමට උපකාර වේ.

සමාජය යනු පුද්ගලයන් අතර සම්බන්ධතා ජාලයකි. එම නිසා පුද්ගලයා හා සමාජය අතර පවතින්නේ ඇඩි සබඳතාවයකි. එහි දී තමා ගැන පමණක් සිතා කටයුතු කිරීම හෙවත් ආත්මාර්ථය වෙනුවට පොදු හැඟීමෙන් ක්‍රියා කළ යුතු ව තිබේ. බුදු දහම සැමවිට ම මඟ පෙන්වා ඇත්තේ උභයාර්ථය සාධනීය වැඩපිළිවෙළ කට ය. එනම්, තමා ගේ ත්, අනුන් ගේ ත් යහපතට හේතුවන ආකාරයේ කටයුතුවල නිරතවීමයි. තමා ගේ ත්, අනුන් ගේ ත් අසහනයට හේතුවන සිත, කය, වචනය යන තිදෙරින් සිදුවන දුසිරිත්කම් තුළින් අකුසල් සිදුවන බවත්, සුසිරිත්කම් තුළින් සහනයට හේතු වන කුසල් සිදුවන බවත් මෙහිදී පෙන්වා දී තිබේ.

දැහැමි දිවි මගේ පදනම බෞද්ධයා ගේ නිත්‍ය ශීලය වන පංචශීල ප්‍රතිපදාවයි. දුසිරිත් පහකින් හා වැරැදි දහයකින් (දස අකුසල්) වෙන්වීම පුද්ගල හා සමාජ දියුණුවේ පදනමයි. බෞද්ධයකු වන බවට ලබා දෙන ප්‍රතිඥාව වන්නේ පන්සිල් සමාදන් වීමයි. පන්සිල් රැකීමට පොරොන්දු වන්නේ තෙරුවන් සාක්ෂි කරගෙන ය. එසේ පොරොන්දු වන්නේ වෙන කිසිවකු සමග නොව තමා ම සමග ම වීම ද විශේෂත්වයකි.

" අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයේ " තමා උපමා කොට ගෙන අනුන් නොනැසිය යුතු ය. කායික හෝ මානසික පීඩා ගෙන දීමෙන් වැළකිය යුතු ය. පංචශීල ප්‍රතිපදාවෙන් කියැවෙන්නේ එය යි. අනුන් කෙරෙහි කරුණාව හා මෛත්‍රිය ඇති කිසිවකුට අනුන් ඝාතනය තබා අනුන්ට හිංසා පීඩා කරදර කිරීමට පවා සිත් පහළ නොවේ.නොදෙන කිසිවක් කිසිවකුගෙන් ගැනීම බරලතළ වරදක් බව දෙවන සික පදයෙන් කියැවේ. මේ තුළින් සොරකම වංචාව ආදියට ඉඩක් නැත. දැහැමි දිවි පෙවෙතකට ඉන් මඟ පැදේ. අන්සතු දෙයට ආසා නොකරන, අනෙකා ගේ අයිතින් සුරකින සමාජයක් ඉන් ගොඩ නැගේ. සමාජයේ පවතින ගැටලු රාශියක් විසඳ ගැනීමට මින් මඟ පැදේ.

කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වීම තුන්වන සිකපදය යි. කාම ලෝකයේ කාමයේ හැසිරීම වැරැද්දක් නොවේ. එකී කාමය පසිඳුරන්ගෙන් ම (ඇස කන නාසය දිව ශරීරය) ක්‍රියාත්මක වේ. එය පාලනය කරන්නේ අප ගේ මනස යි. එම නිසා කාම සිත කුඩා කල සිට ම මනා හික්මීමකින් පාලනය කර ගත යුතු ය. එසේ නැතහොත් කාමයෙහි වරදවා හැසිරීමට සිත පුරුදු වෙයි. මේ නොහික්මුණු කාම සිත් හා සිතුවිලි සමාජයේ දුසිරිතට හේතු වේ.

සිව්වන සික පදය බොරු කීමෙන් වැළකීම යි. සත්‍ය ගරුක, අවංක සමාජයක පදනම එය යි. බෞද්ධ සමාජයක බොරුවට, රැවටීමට, අසත්‍යයට ඉඩක් නැත. බොරුකාරයාට කෙදිනකවත් සත්‍යය කරා ළඟා විය නොහැක.

පස්වැනි සික පදය මදයට හා ප්‍රමාදයට හේතුවන මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම යි. මෙයින් පුද්ගලයා සැම අංශයකින් ම පරිහානියට පත්වන බව ඉතා පැහැදිලි කරුණකි. මත් ද්‍රව්‍යය භාවිතය බරපතළ සමාජ ගැටලුක් වී ඇති ආකාරය දැක ගත හැකි ය. මෙයින් වෙන් වූ පුද්ගලයා තම දෙලොව දියුණුව ම සලසා ගනියි.

මේ ආකාරයට පන්සිල් පිළිවෙත් හි පිහිටි පුද්ගලයා ලොව උසස් ම මිනිසා බවට පත්වීම සඳහා තම මූලික ජීවන පදනම සකස් කර ගනියි. මෙලොව දියුණුව පමණක් නොව එය ලෝකෝත්තර දියුණුවට ද මඟ සලසයි.

> **බුදු දහම මෙලොව දිවියෙන් පලායාමක් නොවේ. සියල්ල අසුභ ලෙස දකින, මෙලොව බැහැරකොට පරලොව සඳහා ම පමණක් වූ දහමක් ද නොවේ. දුක ගැන පමණක් නොව සැප ගැන ද කතා කරන දහමකි.**





## යුද්ධයට පෙර

# රට ස්වයංපෝෂිත කිරීම රජතුමා ගේ අරමුණ යි

දුටුගැමුණු මහ රජතුමා 46

**සිරිනාගට සියුම් කෝපයක් ඇතිවිය. එහෙත් ඒ බවක් නොපෙන්වා සුහද ව කතා කළේ ය.**

"මහ සෙනෙවිතුමනි, බෝධිනාග කෙනෙක් මාගම නැහැ. සමහරවිට ඔහු කැලණියේ සිටිනවා විය හැකියි. ඔහු මගේ පියා වුණත් මා තුළ තියෙන්නේ වෛරයක්. තමන් ගේ දරුවා කෙරෙහි කරුණාවක් ආදරයක් නැති තාත්තා කෙනකුගෙන් ඇති වැඩේ කුමක්ද? නමුත් ඔහු කෙසේ හෝ හමුවීමේ වුවමනාවක් මටත් තිබෙනවා"

"බෝධිනාග භයානක මිනිහෙක්. ඒ නිසා ඔහු හමුවන්නට උත්සාහ ගන්න එපා."

මිත්‍ර සෙන්පති පැවසුවේ බියට පත් විලාසයෙනි. ඔහු මොහොතක් කල්පනා බරව සිටියේ ය. පසුව තිගැස්සී සිහි එළවා ගත්තේ ය. සිරිනාග දෙස බැලුවේ ය. තම මැණියන් ගේ ඝාතකයන් සොයන සිරිනාගගෙන් මතු යම්දිනක තමාට එල්ල විය හැකි මරණ බියක් ඔහු ගේ හිතට දැනෙන්නට විය. බෝධිනාග ගේ ත්, විමලී කුමරිය ගේ ත් ආදරය දුටු තමන් තුළ ඇති වූ ඊර්ශයාව නිසා තමන් ගේ අතින් ම ඇය ගේ ආහාර බඳුනට වස දැමූ සැටිත් ඔහුට සිහිපත් විය.

සිරිනාග බලා සිටියේ ය. මිත්‍ර සෙනෙවි කිසියම් අවුල් සහගත තත්ත්වයකින් පසුවන බවක් දැනෙන්නට විය.

"රාත්‍රී භෝජනය සූදානම්. සිරිනාග සමග පැමිණෙන්න."

මහ සෙනෙවි බිරිඳ පැමිණ ආරාධනා කළා ය.

"ස්තුතියි ආරාධනයට. අද ජයනාථ සිටුතුමා ගේ මන්දිරයේ උත්සවයක් තිබෙනවා. රෑ කෑමට පැමිණෙන ලෙසට සිටු දේවිය ආරාධනා කළා. ඒ ආරාධනාව මගහැරිය නොහැකි යි.

"හොඳයි, සිරිනාග එහෙනම් හෙට රාත්‍රී කෑමට මෙහි එන්නට ඕනේ."

"හොඳමයි, මහ සෙනෙවිතුමනි, එහෙනම් මට යාමට අවසර. සිරිනාග නැඟී සිට මිත්‍ර සෙනෙවිට ආචාර කළේ ය. මැදුරෙන් පිට වූ සිරිනාග තම අසු පිටට නැඟී වේගයෙන් ගමන් ඇරඹුවේ ය. තමන් ලොකු උගුලකින් බේරුණ බව ඔහුට හැඟිණි. ඔහුගේ සිත නොයෙක් සිතිවිලිවලින් බර විය.

ඔහු නිවසට පැමිණියේ ය. ඔහු අසුනක හිඳගෙන ටික වේලාවක් කල්පනාවේ නියැළුණේ ය. විවේකයෙන් සිටිය හොත් සිටුතුමා සමග මද වේලාවක් පිළිසඳරෙහි යෙදීම සිතට සහනයක් වනු ඇතැයි කල්පනා කළේ ය.

"එන්න සිරිනාග සෙනෙවිතුමනි, ඔබ බර කල්පනාවක වගෙයි. ගැටලුවක් ද?"

"මහ සිටුතුමනි, දරා ගත නො හැකි වේදනාවකින් මිදෙන්නට උත්සාහ කළත් එය අපහසු නිසා ඔබතුමා සමග කතා කරන්නට සිතුණා. ඔබතුමාට බාධා කළාට සමා වන්න."

"සිරිනාග ගේ ස්වරූපයෙන් මට ඒ බව අවබෝධ වුණා. අද ඔබ ප්‍රමාද වුණේ විශේෂ රාජකාරී කටයුත්තක් දී තිබුණු නිසා ද?"

"නැහැ, මිත්‍ර සෙනෙවිතුමා ඔහු හමු වන ලෙසට මට ඇනුම් දී තිබුණා"

"තොප කැඳවූයේ කුමක් සඳහා ද? සිරිනාග ඔහු මහා අසත්පුරුෂයෙක්. ඒ නිසා ඔහු සමග ඇසුර බොහෝ පරිස්සමින් කරන්නට ඕනේ. ඔහු නිතර හමුවන්නට යාමත් එතරම් හොඳ දෙයක් නොවෙයි."

"සිටුතුමනි, මට ඒ බව වැටහෙනවා. අද ඔහු මගෙන් ප්‍රශ්න ගණනාවක් ඇසුවා. ඔහු කුමක් හෝ කරුණක් නිසා යම්කිසි අසහනයකින් පසුවන බව පෙනෙනවා. දීඝජන්තු මහා සෙනෙවිතුමාට හිතවත් වෙන්නට එපා කීවා. දීඝාභය කුමාරයා ගැනත් බොහෝ ප්‍රශ්න කළා. අන්තිමේ දී ඔහු බැණ වැදුනේ බෝධිනාග පියතුමාට"

"බෝධිනාග සත්පුරුෂ මනුස්සයෙක්. ඔහුගෙන් මිත්‍ර සෙනෙවියාට යහපතක් මිස අයහපතක් සිදු වෙලා නැහැ."

"සුමන සිටුතුමා ගේ ඝාතනය සිදු කළේ බෝධිනාග කීවා. විමලීට වස දී මරා දැම්මේ ඔහු බව කීවා. ඔහු මෙහෙන් රැගෙන ගිය විශාල ධනස්කන්ධය වියදම් කරලා, මාගම විශාල මන්දිරයක් ඉදිකර, එහි සිටුවරයෙක් ලෙස ජීවත් වන බව ද කීවා."

"මිත්‍ර සෙනෙවියා පව්කාරයෙක්. මංකොල්ලකාරයෙක්, මිනී මරුවෙක්. ඔහු තමන් කළ පව අනුන් පිට පටවන්න උත්සාහ කරනවා."

"මොහු විසකුරු සර්පයෙක් සිටුතුමනි, ඔහු ගේ විස දළවලින් මට දෂ්ට කරන්නට වැඩි කලක් ගත වන එකක් නැහැ. ඔහුට කලින් මගේ අත ඉක්මන් නොවුණොත් මගේ අම්මාට ත්, ඇගේ මව්පියන්ට ත් වුණු දේ මට ත් වෙන්න පුළුවන්."

"පුතා කලබල වෙන්න එපා. සන්සුන් වෙන්න. කෝපකාරි සිතිවිලිවලින් ඈත් වෙන්න. සිතට විවේකයක් දෙන්න."

මේ මොහොතේ සිටුදියණිය මී පැණි බඳුන් දෙකක් ගෙන සිය මව සමග ආලින්දයට පැමිණියා . එය සිරිනාගට හා පියාට පිළිගැන්වූ පසු ඇය මව ළඟට වූවා ය.

"සිරිනාග, ඔබ රාත්‍රී ආහාරය ගෙන එන්නට ඇතැයි සිතූ නිසා ආරාධනා කළේ නැහැ. අපි කෑම ගෙන අවසන් වුණේ දැන්."

'මැණියනි, අද දවස හරිම වෙහෙසයි. රාජකාරී නිම වී එන්නට සූදානම් වන විට මිත්‍ර සෙනෙවිතුමාගෙන් කැඳවීමක් ලැබුණා. ඔහු සමග හෝරාවකට වඩා වැඩි කාලයක් සාකච්ඡාවේ යෙදී සිටියා. සෙනෙවිතුමා ගේ බිරිඳ රාත්‍රී භෝජනය සඳහා ආරාධනා කළා. සිටු මැදුරේ දේවිය රාත්‍රී භෝජනය සඳහා ආරාධනා කර තිබෙන බව පවසා එතැනින් ගැලවී ආවා."

"ඒක හොඳයි සිරිනාග, සැක සහිත තැන්වලින් ආහාර ගන්න එපා."

හිස් බඳුන් දෙක ගත් සිටුදියණිය මවත් සමග ආලින්දයෙන් පිටවූයේ ඔවුනට තවදුරටත් කතා කිරීමට ඉඩ දෙමිනි.

"සිරිනාග ඉතින් දැන් කියන්න, ඔබේ පියා බෝධිනාග ඉන්නේ කැලණියේ ද? මාගම ද?"

"මිත්‍ර සෙනෙවිතුමාට මා කීවේ බෝධිනාග ඉන්නේ කැලණියේ කියා යි. නමුත් බෝධිනාග ඉන්නේ මාගම යි. එතුමා දුටුගැමුණු කුමාරයා සමග සටන් බිමට පිවිසීමට බලාපොරොත්තුවෙන් ඉන්නේ. ඒ සඳහා අවසරය පතා තිස්සමහාරාම විහාරයට අයත් කුඹුරුවල වගා කටයුතු භාර ව සිටිනවා. සත්‍ය තොරතුරු සියල්ල ඔහු මට පැවසුවා. මා ගැමුණු සේනාංකයේ සේවය කරන බව පැවසූ විට පුත් සෙනෙහසින් මා බදාගෙන කඳුළු වැගිරුවා. මා එදා මා ගැන බොහෝ කනගාටුවට පත් වුණා. මා, මට ම ද්වේශ කර ගත්තා. තනතුරුවලට ආශාවෙන්, ධනයට මුදලට කැදරකමින්, තමන් ගේ ආගමට ජාතියට ද්‍රෝහී වන සිංහලයන් කෙරෙහි මට ඇති වුණේ දුකක්. සිංහල ජාතිය යළි ගොඩ නඟන්නට පර සතුරන්ගෙන් මේ රට මුදා ගන්නට, රට එක්සේසත් කරන්නට දුටුගැමුණු කුමාරයා දරන සටනට හැකි උපරිමයෙන් සහාය දෙන බවට මහාසිව මාහිමිපාණන් වහන්සේ ඉදිරියේ මා එදා ප්‍රතිඥා දුන්නේ ඒ නිසයි."

"බෝධිනාග අවංක මනුස්සයෙක්. විශ්වාසය, ස්වාමි භක්තිය ඔහු ළඟ තියෙනවා. ඔහු සිටින තැනක්වත් අපට නොදැන්නුවේ අපේ ආරක්ෂාවටයි. සිරිනාග දන්නා සියල්ල රහසක් ලෙස රැක ගන්නට ඕනේ."

"ඔව් සිටුතුමනි මා එය සිතට ගෙන අවසානයි, මට මෙහි සිටින මගේ පියාත්, නෑයාත් ඔබතුමා යි. අද ඔබතුමා ගේ කාලය හෝරාවකටත් වඩා මා වෙනුවෙන් වැය කළා. මට යෑමට අවසර"'

"සිරිනාග, නුඹගේ අලුත් තනතුර වෙනුවෙන් හෙට හවස ශ්‍රී මහා බෝධිය අසල දී බෝධි පූජාවක් තැබීමට දේවිය කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ නිසා සවස පහට පමණ ශ්‍රී මහා බෝධි මලුවට පැමිණෙන්න."

විවේකයෙන් සිටින සෑම අවස්ථාවක ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ පුදා ගැනීම සිරිනාග ගේ සිරිතකි. එමගින් සොළින්ගෙන් ශ්‍රී මහා බෝධීන් වහන්සේට සිදුවන හානිය, නිගරුව වළක්වා ගත හැකි බව ඔහුගේ අදහස යි.

එළාර රජතුමා ගේ දියණිය කෘෂ්ණා කුමරිය ද සොළී භටයන් බෞද්ධ සිද්ධස්ථානවලට සිදු කරන නිගරුව ගැන ප්‍රසිද්ධියේ ම සොළී භටයන්ට දෙස් නැඟීමෙන් සිදු වූ යහපත ද සිරිනාග සිතට ගත්තේ ය.

ජයනාථ සිටු දේවිය තමන් වෙනුවෙන් පවත්වන බෝධි පූජාවට සහභාගී වීම සඳහා සිරිනාග නිවසින් පිටත් විය. නියමිත වේලාවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ අසලට පැමිණි ඔහු දුටුවේ බෝධි මලුව සිංහලයන්ගෙන් පිරී ඇති ආකාරයයි. ඔහුට මතක ඇති දිනක මෙතරම් විශාල පිරිසක් බෝ මලුව වෙත පැමිණ සිටියේ නැත.

අනුරාධපුර නගරයේ වෙසෙන ප්‍රභූ පවුල්වල කාන්තාවන් සිය දියණිවරුන් සමග පැමිණ සිටියේ මහා සිටු දේවිය ගේ ආරාධනය මත විය යුතු යැයි සිරිනාගට සිතිණි. ඔහු පුදුමයට පත් කරමින් එළාර මහා රජු ගේ දියණිය කෘෂ්ණා කුමරිය ද සිය පිරිවර සමගින් පැමිණ සිටියා ය. ඒ අතර දන්ති කුමරිය ද වූවා ය.

අයන්ති විතාන

පිටු සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ
කාශ්‍යප බණ්ඩාර







# උපුල්වන් දෙවොල සමීපයේ පිහිටි
# දෙවිනුවර පරමවිචිත්‍රාරාම රාජ මහා විහාරය

ශාසනාරක්ෂක උපුල්වන් දෙවිඳුන් වෙනුවෙන් ඉදි වූ ප්‍රධානතම පූජනීය ස්ථානය වන දෙවුන්දර උපුල්වන් දේවාලයට සමීප ව පරමවිචිත්‍රාරාම රාජමහා විහාරස්ථානය මාතර තංගල්ල මහා මාර්ගයට යාබද ව දෙවුන්දර නගර මධ්‍යයේ පිහිටා ඇත.

පිරිනිවන් මංචකයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ශක්‍ර දේවේන්ද්‍රයා අමතා,

"පතිට්ඨිස්සති දේවින්ද ලංකායං මම සාසනං - තස්මා සපරිවාරන්තං රක්ඛ ලංකඤ්ච සාධුකං"

යනුවෙන් සම්බුදු සසුන චිරස්ථායී ව පවතින ලංකා ද්වීපය ආරක්ෂා කරන ලෙස වදාළහ. බෝසතාණන් වහන්සේ සම්බුද්ධත්වයට පත් වන අවස්ථාවෙහි නව විධ වර්ෂා පවත්වමින්, දස මාර සෙන් පිරිවරා පැමිණි වසවර්ති මාර දිව්‍ය පුත්‍රයා ගේ උපක්‍රමයන්ට බිය වී සියලු දෙවිවරුන් පළා යද්දී බෝසතුන් තනි නොකරමින් රැඳී සිටි උත්පලවණ්ණ හෙවත් උපුල්වන් දෙවිඳුන් වෙත සක් දෙවිඳුන් එම වගකීම භාර කළෙන් ශාසනාරක්ෂක දේවතාවා ලෙස උපුල්වන් දෙවිඳුන් සම්භාවනාවට පත් කෙරෙයි.



විහාරාධිපති
දෙවිනුවර සුනන්ද අනුනාහිමි

බුද්ධ පරිනිර්වාණ දිනයේ ම ලක්දිවට පැමිණි විජය කුමරුන්ට, මිනිස් වෙසකින් පැමිණි උපුල්වන් දෙවිඳුන් පිරිත් නූල් බැඳ ආශිර්වාද කළ බව මහාවංශයේ සඳහන් වෙයි.

රාම රාවණා යුද්ධයේ දී ද්වන්ධ සටන් සිදු වූ ස්ථානය ලෙස පසුකාලීන ජනප්‍රවාදක් ගොඩනැඟී තිබීම නිසා රාවණා රජු ගේ ගෙල කැපී වැටුණු තැන යන අදහසින් මෙම පෙදෙස ගිරිහෙළ ලෙස හැඳින් වූ බව විශ්වාසය යි. සුදු හෙවත් හෙළ පැහැති ගලක් පැවතීම නිසා ගිරිහෙළ වූ බවත් මතයකි. මේ ප්‍රදේශයට කිරළ ලෙස ව්‍යවහාර කළ බවට ද මතවාද පවතී. ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ දී ග්‍රීක ජාතික ටොලමි නිර්මාණය කළ ලෝක සිතියමේ ලක්දිව දකුණු තුඩුව මහා දෙවියා වන දෲගොස් වෙනුවෙන් කැප කළ දගන ලෙස දක්වා තිබේ.

දෙවියන් වාසය කරන නගරය යන අරුත දෙන දෙවිනුවර, දෙවුන්දර , තෙනවර, තෙයිවාන් තුරෙයි යන ග්‍රාම නාමෝත්පත්තිය ඛදිරාළි විහාරයට සබැඳේ.

දෙවන දප්ඵුල හෙවත් දාපුළුසෙන් රජු කිහිරි කඳක වේශයෙන් උපුල්වන් දෙවිඳුන් මුහුදින් මෙම ප්‍රදේශයට වැඩම කළ නිසා ඛදිරාලි විහාරය තනවා දෙවිඳුන් පිදූ බව මහාවංශයේ කියැවෙයි. කිහිරි කඳින් කළ උපුල්වන් දේව ප්‍රතිමාවක් මුහුදේ පාවී ගොඩගැසූ සේ වියතුන් දක්වයි. මේ නිසා උපුල්වන් දෙවිඳුන් හැඳින්වීමට කිහිරැළි උපුල්වන්, ඛදිරදේහලී උත්පලවර්ණ යන යෙදුම් භාවිත වෙයි.



දාපුළුසෙන් රජතුමා කරවූ චෛත්‍යය වටා පළමුවන විජයබාහු රජතුමා වටදාගෙයක් කරවීය. අෂ්ට මූලායතනයන් අතරට පැමිණි ගලතුරුමූල පිරුවන දෙවිනුවර විහාරාශ්‍රිත ව පැවතුණි. මහා පරාක්‍රමබාහු රජ දවස දිඹුලාගල මහා කාශ්‍යප තෙරණුවන් ගේ නායකත්වයෙන් ශාසන ශෝධන කටයුතු සිදු කරද්දී ගලතුරුමූල පිරුවනේ නන්ද හිමියන් රුහුණේ සඟ රුවන පිරිවරා ඊට සම්බන්ධ වූ පුවත් මහාවංශයේ කියැවේ.

නිශ්ශංකමල්ල රජු ගේ සෙල්ලිපිවල දෙවිනුවර ග්‍රාම, විහාර නාම සඳහන් වෙයි.

දඹදෙණි යුගයේ දෙවැනි පැරකුම්බා රජතුමා දෙවිනුවරට ගොස් පූජා පවත්වා තමාට වැළඳුණු ව්‍යාධියක් සුව කර දෙන ලෙස උපුල්වන් දෙවිඳුන්ගෙන් අයැද සිටි බවත්, එය සිදු කළ නොහැකි බව දෙවිඳුන් සිහිනෙන් පැවසූ බවත් මහාවංශය සඳහන් කරයි. චන්ද්‍රභානු ජාවක රජු සමඟ සටනින් ජය ලැබූ පසු දෙවැනි පැරකුම්බා රජතුමා ගේ බෑණා වූ වීරබාහු කුමරු විසින් දෙවිනුවර විහාරයේ නන්දන පිරුවන ද ආරම්භ කරවන ලදී. සිව්වන පැරකුම්බා රජතුමා මනහර දෙරටු දෙකකින් හා දීර්ඝ අන්තරාලයකින් යුත් බුදුරදුන් සිංහ සෙය්‍යාවෙන් සැතපී සිටින ඉරියව්වෙන් වැඩ සිටින ඔත් පිළිම ගෙයක් කරවා ඇත. කර්තෘ අඥාත ව පවතින තිසර සන්දේශය රචනා කළේ ගම්පොළ යුගයේ දෙවුන්දර වෙහෙරවැසි හිමි නමක ලෙස වියතුන් අනුමාන කරයි. කෝට්ටේ යුගයේ පංච මහ පිරුවෙන් අතර එකක් වූ දෙවිනුවර ඉරුගල් කුලතිලක පිරුවනේ අධිපති තිලක පිරුවන්පති හිමිපාණෝ සිංහල සන්දේශ කාව්‍ය අතර වැඩිම දිගින් යුතු කෝකිල සන්දේශය රචනා කළහ. පෘතුගීසි ආක්‍රමණ හමුවේ දෙවිනුවර විහාරය සහ දේවාලය මුළුමනින් ම විනාශයට පත් වූ අතර පසු කාලයේ උපුල්වන් දෙවිඳුන් වෙනුවට විෂ්ණු දෙවිඳුන් මෙහි පූජාර්හත්වයට පත් විය.

වටදාගෙය සහිත වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, හිටි පිළිම ගෙය, ඔත් පිළිම ගෙය, ගලතුරුමූල ප්‍රාසාදය, රත්පත්සුළුපාය නම් සංඝාවාසය, මහවත්මඬුව නම් ධර්ම මන්දිරය පිළිබඳ සන්දේශ කාව්‍යයන් හි තොරතුරු අන්තර්ගත ය. අනුරාධපුර සහ පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා, ගොඩනැගිලි නටබුන්, සෙල්ලිපි විහාර බිමේ විසිරී පවතී.

දාගැබ පමණක් ශේෂ වී අනෙකුත් සියලු ඉදිකිරීම් පාදමට පමණක් සීමා වී පැවතුණු දෙවිනුවර විහාරයට පුනර්ජීවනය සලසන ලද්දේ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් ගේ ශිෂ්‍යවර වටරක්ගොඩ ධම්මපාල මාහිමියන් ගේ ශිෂ්‍ය බෝවල ධම්මානන්ද හිමියන්ගේ ශිෂ්‍යවර අත්තුඩාවේ ධම්මරක්ඛිත මාහිමිපාණන් වහන්සේ වෙතිනි. මුහුදුබඩ ලන්දේසි පාලනයේ අවසාන භාගයේ ප්‍රදේශවාසීන් ගේ අනුදැනුම පරිදි නටබුන් ව පැවති දෙවුන්දර වෙහෙරට පැමිණි අත්තුඩාවේ ධම්මරක්ඛිත හිමිපාණෝ කුඩා විහාරයක් සහ සංඝාවාසයක් තනවා විහාරස්ථානයේ පුනර්ජීවනය ආරම්භ කළහ. වර්ෂ 1813 දී ඉංග්‍රීසි ආණ්ඩුව මෙම පුදබිම ධම්මරක්ඛිත හිමියන් වෙත පවරා දුනි.

බෝවල ධම්මානන්ද හිමියන්ගේ ශිෂ්‍යවරයකු වූ වැලිතර මහකරාවේ ඤාණවිමල තිස්ස හිමියන් ඇතුළු හිමිවරුන් පිරිසක් වර්ෂ 1802දී බුරුම රට අමරපුරයට ගොස් උපසම්පදාව ලබා පැමිණ ලක්දිව අමරපුර මහා නිකාය ආරම්භ කළහ. මෙම ආදර්ශය ඔස්සේ ගුරුදෙවි බෝවල මාහිමියන් ගේ අවසරය හා අනුග්‍රහය පරිදි අත්තුඩාවේ ධම්මරක්ඛිත හිමියන් පොල්වත්තේ සරණපාලතිස්ස හිමි, කිරින්දේ ධම්මානන්දතිස්ස හිමි, මිරිස්සේ සුමතිසාරතිස්ස හිමි, වවුලාවේ නන්දසාරතිස්ස හිමි සහ විමලබුද්ධිතිස්ස නමින් පැවිදි වූ සලො උපාසක යන පිරිස බුරුම රට අමරපුරයට ගොස් බුද්ධ වර්ෂ 2351දී ස්වර්ණගුහා සීමාවේ දී ඤාණාභිවංස ධම්ම සේනාධිපති මහාරාජගුරු බුරුම සංඝරාජ හිමියන් උපාධ්‍යාය කොට උපසම්පදාව ලබා ලක්දිව වැඩමවා දෙවිනුවර විහාරයේ සීමා සම්මත කරවා උපසම්පදා කර්ම සිදු කළහ. මිහිරිපැන්නේ නිකාය නමින් ව්‍යවහාර කළ මෙම සඟපරපුර වර්තමානයේ අමරපුර ධර්මරක්ෂිත නිකාය ලෙස හඳුන්වනු ලබයි.

අත්තුඩාවේ ධම්මරක්ඛිත මාහිමියන්ගේ ශිෂ්‍ය අංගහවත්තේ රතනජෝති මාහිමියන් ස්වකීය කනිෂ්ඨ පැවිදි සහෝදර කිරලවැල්ලේ සරණපාල හිමියන් ගේ ශිෂ්‍ය ජම්බුවත්තේ පියරතන හිමියන් ගේ උපකාර ලබමින් විවිධ බාධක දුරලමින් විහාරාධිපතිත්වය හෙබවූ හ. ඉන් පසු ජම්බුවත්තේ පියරතන හිමියන් විහාරාධිපතිත්වයට පත් වූ අතර, මෙතැන් සිට දෙවිනුවර විහාරය අමරපුර කල්‍යාණිවංශ නිකායික විහාරස්ථානයක් බවට පත් විය. දෙවිනුවර සිරිනිවාස අනුනායක හිමියන්ගෙන් පසු වර්තමානයේ අමරපුර කල්‍යාණිවංශ මහා නිකායේ අනුනායක දෙවිනුවර සිරි සුනන්ද අනුනායක ස්වාමින්ද්‍රයන් වහන්සේ විහාරාධිපතිත්වය හොබවති.

දිමුතු පුන්සර කොළඹගේ